UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය
# ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්
# 2016

# மனிதவள மேம்பாட்டு நிறுவகம்
# கொழும்புப் பல்கலைக்கழகம்
# ஸ்ரீலங்கா

# ஆண்டறிக்கை மற்றும் வருடாந்த கணக்குகள்
# 2016

# INSTITUTE OF HUMAN RESOURCE ADVANCEMENT
*University of Colombo*
SRI LANKA

# ANNUAL REPORT AND ANNUAL ACCOUNTS
# 2016

# මානව සම්පත් අභිවර්ධන ආයතනය (මා.ස.අ.ආ.)

# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව - 2016

## 1. දැක්ම

*අභියෝගාත්මක ගෝලීය තත්ත්වයනට මුහුණ දිය හැකි සහ අපගේ ජාතික සංවර්ධනයේ මිනිස් පදනම ශක්තිමත් කළ හැකි වූ පරිණත සහ බුද්ධිමත් "දැනුම-භාවිතකරන්නන්" ලෙසින් මානව සම්පත අභිවර්ධනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම ඇප කැප වූ ඉහළම තත්ත්වයේ පිළිගත් ආයතනයක් බවට පත්වීම.*

## 2. මෙහෙවර

*"උපයමින් ඉගෙනීම" කරන සේව්‍ය, සේවක සහ ව්‍යවසායක වූ සේවා-කාණ්ඩ සඳහා තම හැකියාවන් ඉහළ නැංවීමට පූර්ණ තත්ව-කළමනාකරණ ක්‍රියාවලිය ඔස්සේ ඉහළ මට්ටමේ පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා ගැනීමට පහසුකම් සපයමින් මග පෙන්වීම.*

*ඔවුන්ගේ විචාරාත්මක සහ තර්කානුකූලව සිතීමේ හැකියාව, ආචාරධර්ම, ප්‍රමිතීන්, ව්‍යවසාය දක්ෂතා, නායකත්ව ලක්ෂණ සහ යුතුකම් හා අයිතිවාසිකම් එකිනෙක මත රඳා පවතින බව අවබෝධ කොට ගෙන තිබීම ආදිය හොඳින් වර්ධනය කර ගැනීමට තව දුරටත් මග පෙන්වීම.*

*දේශයේ "දැනුම්-ආර්ථිකය" සඳහා බලපෑමක් ඇති කළ හැකි දායකත්වයක් දැක්වීමට ඉහළ පෙළේ මිනිස් සම්පත් සමූහයක් ලෙස පෙළ ගැසුණු දැනුම්-සේවා-කාණ්ඩ උත්පාදනය කිරීමට කැපවීම.*



## 3. වටිනාකම්

- *නවෝත්පාදන සංවිධානය*
- *ඉලක්ක සපුරා ගැනීමට කැපවීම*
- *විෂය අන්තර්ගතයන්හි විවිධත්වය*
- *පර්යේෂණ සහ සංවර්ධන සංස්කෘතිය*
- *විශ්වසනීයත්වය*
- *වගකීම සහ වගවීම*
- *සාමග්‍රිය*
- *සමාන අවස්ථා*



## 4. අධ්‍යක්‍ෂකගේ සමාලෝචනය



*'අපගේ සමාජය ප්‍රගතියට හා ඉදිරියට යා යුතු බව අපි විශ්වාස කරමු. එමෙන්ම ප්‍රගතිය ක්‍රමානුකූලව දිගින් දිගටම පවත්වා ගැනීමට අපි උත්සහ කරන්නෙමු. එම ප්‍රගතිය අපගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ දේශපාලනික අභිලාෂයන් සාකල්‍යව වැළඳ ගැනීම අපි ඉලක්ක කරමු. ප්‍රගතිශීලි සමාජයක් යනු එහි ජීවත් වන ජනතාවගේ සමාජ, සංස්කෘතික සහ දේශපාලන අභිලාෂයන් යථාර්ථයක් බවට පත් කරන්නා වූ සංසදයක් බව අපි විශ්වාස කරන්නෙමු.'*

2016 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මම මහත් භාග්‍යයක් කොට සලකමි. මෙම කාල වකවානුවේදිත් අධ්‍යයන වපසරිය තුළ සහතික මට්ටමේ සිට පශ්චාත් උපාධි මට්ටම දක්වා පුළුල් පරාසයක අධ්‍යාපනය සම්පාදනය කරන්නා වූ ප්‍රමුඛ පෙළේ ආයතනයක් ලෙස මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් නොකඩවා ජාතියට සේවා සම්පාදනය කෙරිණ. මෙම වර්ෂයේදී සැලකිය යුතු විශේෂතම කාරණය නම්, ශාස්ත්‍රීය කමිටුවේ මග පෙන්වීම යටතේ අධ්‍යයන වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීමට මූලික පියවර ගැනීමයි.

2016 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ප්‍රමුඛතම වැඩසටහන වන ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි වැඩසටහන සඳහා ආසන්න වශයෙන් නවක විද්‍යාර්ථීන් 194 ක් ලියාපදිංචි වූ අතර සමස්තයක් ලෙස එම වැඩසටහන තුළ අධ්‍යාපනය ලැබූ විද්‍යාර්ථීන් සංඛ්‍යාව 567 කි. තව දුරටත් ආසන්න වශයෙන් 277 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම හෝ වෘත්තික මට්ටමේ ශිෂ්‍ය පිරිසක් පශ්චාත් උපාධි පාඨමාලාවන්හි අධ්‍යයන කටයුතුවල නිරත වූ අතර එම අධ්‍යයන වැඩසටහන් නම්: ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව, භූතොරතුරු විද්‍යාපති පාඨමාලාව සහ ආපදා කළමනාකරණ විශ්ලේෂණ සහ පාලන විද්‍යාපති පාඨමාලා වේ.

2016 වර්ෂයේදී තමන් සතු විෂයානුබද්ධ දැනුම පුළුල් කර ගැනීම සඳහා ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 320 ක් වන අතර ශිෂ්‍යයෝ 6,388 ක් සහතික පත්‍ර පාඨමාලාවන් සඳහා පසුගිය වසර තුළ ලියාපදිංචි වූහ. 2016 වසර තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් වෘත්තිමය රාමුව තුළ දැනුම වර්ධනය උදෙසා පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව 18 ක් වන අතර ශිෂ්‍යයෝ 1,422 ක් එම වැඩමුළු සඳහා සහභාගි වූහ.

දිගු ඉතිහාසයක් ඇති කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අපි, ප්‍රගතිශීලි සමාජයක ජීවත් වන ජනයා වෙනුවෙන් උතුම් ඉලක්ක දෙකක් දියත් කර ඇත්තෙමු. එනම්: අවශ්‍ය කරන්නා වූ ප්‍රමාණයෙන් සහ ගුණාත්මකභාවයෙන් මානව කුසලතා සංවර්ධනය, සාමූහික තෝරාගැනීම් සහ සාමූහික ප්‍රයත්නයන් ළඟා කර ගැනීම වෙනුවෙන් සේවකයන් සහ කළමනාකරුවන් දැනුවත් කිරීම වශයෙනි. ප්‍රගතිශීලි සමාජයක ජීවත් වීමේ සිහිනයක් ඇති සහ අනෙක් පුද්ගලයන් එහි ජීවත්වනු දැකීමට කැමති සැමට, එම සිහිනය යථාර්ථයක් වනු බවට පත් කර ගැනීමට අපි, කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනය හා එක් වන මෙන් ආරාධනා කරමු.



**මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි**
**අධ්‍යක්‍ෂ සහ ශාස්ත්‍රීය කමිටු සභාපති**

# පටුන


| අංකය | මාතෘකාව | පිටු අංකය |
|---|---|---|
| 01. | **දැක්ම** | 1 |
| 02. | **මෙහෙවර** | |
| 03. | **වටිනාකම්** | |
| 04. | **අධ්‍යක්ෂගේ සමාලෝචනය** | 2 |
| | **පටුන** | I -II |
| **05.** | **2016 වර්ෂය තුළ ආයතනය ළඟා කර ගත් සංවර්ධනය සහ ජයග්‍රහණ** | |
| 05.1 | අධ්‍යාපනික ජයග්‍රහණ සහ සංවර්ධන | 3 - 7 |
| 05.2 | පරිපාලනමය ළඟා කර ගැනීම් | |
| 05.3 | භෞතික පහසුකම් ළඟා කර ගැනීම් | |
| 05.4 | ශිෂ්‍යයින්ගේ මෘදු කුසලතා සංවර්ධනය | |
| 05.5 | කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ විෂය බාහිර ක්‍රියාකාරකම් | |
| **06.** | **මානව සම්පත් අභිවර්ධන ආයතනය හැඳින්වීම** | |
| 06.1 | 2016 වර්ෂය තුළ මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන වැඩසටහන් | 7 - 13 |
| 06.2 | **මානව සම්පත් අභිවර්ධන ආයතන කළමනාකරණය** | |
| 06.3 | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලන හා සංවිධාන ව්‍යුහය | |
| 06.4 | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව | |
| 07. | **2016 වර්ෂය තුළ මා.ස.අ. ආයතනයේ කාර්ය සාධනය** | |
| 07.1 | **අධ්‍යයන වැඩසටහන්** | 13 - 19 |
| 07.1.1 | උපාධි අධ්‍යයන වැඩසටහන | |
| 07.1.2 | පශ්චාත් උපාධි වැඩසටහන් | |
| 07.1.3 | විධායක ඩිප්ලෝමා වැඩසටහන් | |
| 07.1.4 | ඩිප්ලෝමා වැඩසටහන් | |
| 07.1.5 | සහතිකපත්‍ර වැඩසටහන් | |
| 07.2 | **2016 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩමුළු විස්තර** | |
| 07.2.1 | මානව සම්පත් කළමනාකරණ අංශය විසින් පවත්වන ලද වැඩමුළු | 19 - 21 |
| 07.2.2 | සේවා කළමනාකරණ වැඩසටහන් අංශය විසින් පවත්වන ලද වැඩමුළු | |
| 07.2.3 | ව්‍යාප්ති වැඩසටහන් අංශය විසින් පවත්වන ලද වැඩමුළු | |

| | | |
|---|---|---|
| 07.2.4 | පුස්තකාලය විසින් පවත්වන ලද වැඩමුළු | 21 - 23 |
| 07.2.5 | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළු | |
| 07.3 | පර්යේෂණ, නව්‍යජනන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | |
| 08. | **අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු** | 24 |
| 09. | **පුස්තකාලය** | 24 - 25 |
| 10. | **මූල්‍ය ක්‍රියාකාරකම්** | |
| 10.1 | 2016 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය | 25 - 49 |
| 10.2 | 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකාරිත්වය/ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ සංශෝධිත ප්‍රකාශය | |
| 10.3 | 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | |
| 10.4 | 2016 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂයට මූල්‍ය කාර්ය සාධනය සඳහා වූ ප්‍රකාශය | |
| 10.5 | විගණකාධිපති වාර්තාව | |
| 10.6 | 2016 වර්ෂයට අදාළ විගණන වාර්තාව පිළිබඳ ආයතනයේ අදහස් | |

# 5. 2016 වර්ෂය තුළ ආයතනය ළඟා කරගත් සංවර්ධනය සහ ජයග්‍රහණ

## 5.1 අධ්‍යාපනික ජයග්‍රහණ සහ සංවර්ධන




*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2016, මා.ස.අ.ආ*

- 2016 වසරේ මානව සම්පත් අභිවර්ධන ආයතනයෙන් අධ්‍යයන කාණ්ඩ 04 ක් යටතේ සුදුසුකම් ලැබූ සහ උපාධිලාභීන් හාරදහස් පන්සිය පනස් නවයක් (4,559) උත්පාදනය කරන ලදි. එය පශ්චාත් උපාධිධාරීන් දෙසිය හැට නවයක් (269) සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් එකොළහක් (11), උපාධිධාරීන් එකසිය විසි හතරක් (124), ඩිප්ලෝමාධාරීන් හාරසිය හතක් (407) සහ සහතිකපත්ලාභීන් තුන්දහස් හත්සිය හතලිස් අටකින් (3,748) සමන්විතය. සමස්ථ පාඨමාලා නිමැවුමෙන් 37% ක් වූ වැඩිම නිමැවුම් අනුපාතය ඩිප්ලෝමා කාණ්ඩයේ පාඨමාලාවන්ගෙන් පෙන්නුම් කෙරුණු අතර අඩුම උත්පාදනය වූ 17% සටහන් වූයේ සහතිකපත් කාණ්ඩයේ පාඨමාලාවලිනි.

- මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2016 මාර්තු මස 16 වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදි, කොළඹ විශ්වවිද්‍යාලයීය උපකුලපති මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ෂවත් අයුරින් පැවැත්වුණු අතර එහි ප්‍රධාන දේශනය ක්‍රමෝපාය සංවර්ධන අමාත්‍යාංශ සංවර්ධන කාර්යාංශයේ කළමනාකාර අධ්‍යක්ෂ මංගල පී.බී. යාපා මහතා විසින් සිදු කරන ලදි. මෙහිදි ඩිප්ලෝමාලාභීන් හාරසිය විසි හතකට (427) ඩිප්ලෝමා පිරිනමන ලදි.



- මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වනු ලබන පශ්චාත් උපාධි පාඨමාවන්හි එක් එක් වැඩසටහනේ විෂය මාලා, වෙළෙඳපොළ අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම වෙනුවෙන් විෂය මාලා සංවර්ධන වැඩසටහනක් 2016 මාර්තු මස 22 සහ 23 යන දිනවල පවත්වන ලදි. පසුව සංශෝධන කොට අවසන් වූ නව විෂය මාලාවන් 2017 මාර්තු මස විශ්වවිද්‍යාල සනාථන සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

- මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වනු ලබන පශ්චාත් උපාධි සහ විධායක ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දී එය උපයෝජනය කිරීම ද 2016 වසරේදී සිදු විය. පසුව, මෙම පහසුකම විද්‍යාපති පාඨමාලාවන් සඳහා ද දියත් කෙරුණි. මෙම වැඩ පිළිවෙළ මගින් ඉගෙනුම්/ ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිදුවන කඩදාසි භාවිතය අවම කිරීමට හැකියාව ලැබිණ.

- භූ අවකාශීය විද්‍යා සහ ආපදා කළමනාකරණ දෙවන ජාතික සම්මන්ත්‍රණය 2016 ජනවාරි මස 18 වන දින කොළඹ විශ්වවිද්‍යාලයීය උපකුලපති මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතන ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. එහි ප්‍රධාන දේශනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ




කෘෂිවිද්‍යා පීඨයේ කෘෂිවිද්‍යාඥ මාහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා මහතා විසින් සිදු කරන ලදි. ඉදිරිපත් කෙරුණු නිබන්ධ සාරාංශ 83 කින් 48 ක් සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කෙරිණ. සම්මන්ත්‍රණය සාර්ථක අන්දමින් පැවැත්විණ.

- දේශක ඇගයීමේ ක්‍රමවේදය හඳුන්වා දුන් අතර අධ්‍යයන තත්ත්ව නඟා සිටුවීමේ අරමුණින් ශිෂ්‍ය පැමිණීමේ ප්‍රතිපත්තියක් උපයෝජනයට කටයුතු කරන ලදි.

- 2016 වසරේ දුරස්ථ සන්නිවේදන ආසියානු සම්මන්ත්‍රණයේදී (ACRS - 2016) ආසියාවේ විශිෂ්ටතම ශිෂ්‍ය පර්යේෂණයට හිමි සම්මානය දිනා ගැනීමට භූතොරතුරු විද්‍යාපති පාඨමාලාවේ උදරංග සමරවික්‍රම මහතා සමත් විය.

## 5.2 පරිපාලනමය ළඟා කර ගැනීම්

- මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය සංශෝධනය කෙරුණු අතර එය විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත.

- ආයතනයේ සියලුම විද්‍යාපති පාඨමාලාවන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත හැකි විය.

- ආයතනයේ සියලුම සේවා කාණ්ඩවල පැවති පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු සිදු කෙරෙමින් පවතින අතර දැනටමත් පිරිසක් බඳවා ගෙන ඇත. අනෙක් පිරිස බඳවා ගැනීමට ද කටයුතු සිදු කෙරෙමින් පවතී.

- ශාස්ත්‍රීය කමිටුවේ මෙන්ම විශ්වවිද්‍යාලයේ මගපෙන්වීමෙන් අධ්‍යයන කටයුතු විධිමත් කිරීමට වැඩසටහනක් දියත් කෙරිණ.

## 5.3 භෞතික පහසුකම් ළඟා කර ගැනීම්

- 2016 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනයට සැළකිය යුතු ප්‍රමාණයකින් යටිතල පහසුකම් දියුණු කර ගත හැකි විය. නව දේශන ශාලාවක් හා කථිකාචාර්යවරුන් සඳහා නව කාමර ඉදි කිරීමේ කටයුතු මෙම වසරේදි අවසන් කරන ලදි. 2017 මැද භාගය වන විට යෝජිත නව ගොඩනැගිල්ල සහ වැසිකිළි සංකීර්ණයේ ඉදි කිරීම් ආරම්භ කිරීමට කටයුතු සූදානම් කර ඇත.

- ආයතනයට උචිත මලාපවහන පද්ධතියක් ස්ථාපිත කිරීම ආරම්භ කිරීම.

- යහපාලන සහ විනිවිදභාවයකින් යුත් තිරසර ආර්ථික සංවර්ධනයක් සහතික කිරීම සඳහා වන රාජ්‍ය දැක්මේ අවශ්‍යතාව සම්පූර්ණ කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේ සිට ආයතනය සඳහා සංවිධානාත්මක ප්‍රතිඵල රාමුවක් පවත්වාගෙන යාමට කටයුතු ආරම්භ කොට ඇත.

## 5.4 ශිෂ්‍යයින්ගේ මෘදු කුසලතා සංවර්ධනය




2016 වර්ෂයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් කළමනාකරණ හා මධ්‍යම මට්ටමේ කළමනාකරණ පාඨමාලා හදාරන සිසුන් සඳහා වැඩමුළු 10 ක් පමණ සාර්ථකව නිම කරන ලදි. මෙම වැඩමුළු ශ්‍රී ලංකා සුදුසුකම් ආකෘතියට අනුකූලව සිසුන්ගේ මෘදු කුසලතා වැඩි දියුණු කිරීම අරමුණු කොට ඇත. එම වැඩමුළු සඳහා සිසුන් එක් දහස් දෙසීය හැත්තෑවක් (1,270) පමණ සහභාගි විය.

- 2016 වසරේදි සේවා කළමනාකරණ වැඩසටහනේ ඉගෙනුම ලබන පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා එළිමහන් පුහුණු වැඩසටහන් 02 ක් සාර්ථකව පවත්වන ලද අතර ඒ සඳහා විද්‍යාර්ථීන් එකසිය පනස් දෙදෙනෙක් (152) සහභාගි විය. එමෙන්ම, මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ සිසුන් සඳහා ද ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් ආයතනය විසින් පවත්වන ලදි.



## 5.5 කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ විෂය බාහිර ක්‍රියාකාරකම්

- ජාතික රාජ්‍ය සේවා ක්‍රිකට් තරගාවලිය - 2016 දී බී කාණ්ඩයේ අනුශූරතාවය දිනා ගැනීමට කොළඹ විශ්වවිද්‍යාලයීය කණ්ඩායමට හැකි වූ අතර ආයතනයේ සේවයේ නියුක්ත එම්.එස්.සී පෙරේරා සහ කේ.ඩී.පී. කුරුගම යන මහත්වරු එම කණ්ඩායමේ ක්‍රීඩකයන් ලෙස සහභාගි විය.




- "අපි අපගේ එක්සත්බව ශක්තිමත් කරමු" යන්න තේමා කොට ගනිමින් සේවා කළමනාකරණ අධ්‍යයන වැඩසටහනේ සිසුන් විසින් "මානව සම්පත් අභිවර්ධන ආයතන ක්‍රිකට් සැණකෙළිය - 2016" නමින් ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කරන ලදි. එය ශිෂ්‍යයින්, ආචාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන සේවක මණ්ඩලයේ එකිනෙකා අතර සුහදත්වය වර්ධනය කර ගැනීමට අනර්ඝ අවස්ථාවක් විය. 2016 මාර්තු මස 06 වන දින විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා භූමියේදී පැවැත්වූ තරගාවලියට කණ්ඩායම් 30 ක් පමණ සහභාගි විය. මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි වැඩසටහන - අංක 06 සිසුන් විසින් ශූරතාවය දිනා ගත් අතර දක්ෂතා දැක්වූවන් වෙනුවෙන් කුඩා කුසලාන 06 ක් සංවිධායක මණ්ඩලය පිරිනමන ලදි. මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි වැඩසටහන - අංක 06 කණ්ඩායමේ ශිෂ්‍ය අයි.යූ. විජේරත්න විසින් තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස සම්මාන ලබා ගන්නා ලදි.




- බී.එල්.ඊ. වසන්ත උදානය - 2016 අවුරුදු උත්සවය ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහනේ විද්‍යාර්ථීන් විසින් සංවිධානය කරන ලදි. ආයතනයේ උපාධිය හදාරන සියලු විද්‍යාර්ථීන්ට මෙය මහඟු අවස්ථාවක් විය. උත්සවය 2016 මැයි මස 15 වන දින විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා පිටියේදී පවත්වන්නට කටයුතු සූදානම් කර තිබුණද පැවති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් එය විශ්වවිද්‍යාලයීය ක්‍රීඩාගාරයේදී පවත්වන ලදි. ආයතන අධ්‍යක්ෂ මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගි විය. වැඩසටහනේ විද්‍යාර්ථීන් 500 කට ආසන්න පිරිසක් උත්සවය සඳහා සහභාගි වූ අතර සංවිධාන කමිටුව විසින් පවත්වන ලද තරගවලින් සිසුහු බොහෝදෙනෙක් ත්‍යාග ලබා ගත්හ.




- බී.එල්.ඊ. ක්‍රිකට් සැණකෙළිය - 2016 නමින් තවත් ක්‍රිකට් තරගාවලියක් ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහනේ සිසුන් විසින් සංවිධානය කරන ලද අතර එම තරගාවලිය එම වැඩසහනේ සිසුන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ආයතන කාර්ය මණ්ඩලයට පමණක් සීමාවිය. කණ්ඩායම් 20 ක් පමණ සහභාගි වූ මෙම තරගාවලියේදී ආයතන කාර්ය මණ්ඩල කණ්ඩායම විසින් ශූරතාවය දිනා ගන්නා ලදි.





- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහනේ තෙවන වසර සිසුන් විසින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ වැඩසටහනක් 2016 සැප්තැම්බර් මස 08 වන දින විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පවත්වන්නට යෙදුණු අතර එහිදී සිය දෙනෙක් (100) පමණ රුධිර පරිත්‍යාගයෙන් දායකත්වය ලබා දෙන ලදී.

## 6. මානව සම්පත් අභිවර්ධන ආයතනය හැඳින්වීම

දශක හතරකට ආසන්න දිගු ඉතිහාසයකට උරුමකම් කියන මානව සම්පත් අභිවර්ධන ආයතනය 1975 වසරේ 1979 අංක 11 නියමාවලිය මගින් සේවක අධ්‍යාපන ආයතනය නමින් ස්ථාපිත කරන ලද අතර එය වර්ෂ 2006 අංක 01 නියමාවලිය මගින් සංශෝධනය කරන ලදී. 2006 වසරේදී සේවක අධ්‍යාපන ආයතනය මානව සම්පත් අභිවර්ධන ආයතනය ලෙස නම් කරන ලදී. මානව සම්පත් අභිවර්ධන ආයතනය රටේ පැරණිතම විශ්වවිද්‍යාලය සහ ලෝකයේ හොඳම විශ්වවිද්‍යාල දහසෙන් එකක් වන කොළඹ විශ්වවිද්‍යාලයට අයත් අධ්‍යයනායතනයකි.

දශක හතරක පමණ ඉතිහාසයක් තුළදී, පෞද්ගලික අංශය වර්ධනය වීම, දැනුමැති ආර්ථිකය ගොඩ නැඟීම, ශ්‍රම බලකායේ ගෝලීයකරණය යනාදී ලෙස මානව සම්පත් අභිවර්ධන ආයතන පරිසරයේ සැළකිය යුතු වෙනස්කම් හා නව ප්‍රවණතා රාශියක් සිදු වී ඇත. මෙම වර්ධනයන් වැළඳ ගැනීමට දරන ප්‍රයත්නයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය අඛණ්ඩව විකාශනය වූ අතර එහි මුල් අරමුණ වූ "සේවා කණ්ඩායම් දැනුවත් කිරීම" සඳහා නව අර්ථයක් ලබා ගෙන ඇත. වර්තමානයේ "සේවා කණ්ඩායම්" යනු "කළමනාකරණ/ වෘත්තික සේවා කණ්ඩායමක්" වන අතර මානව සම්පත් අභිවර්ධන ආයතනය මෙම "කළමනාකරණ/ වෘත්තික සේවා කණ්ඩායම" මානව කුසලතාවලින් සංවර්ධනය කිරීමට කැපවී සිටී.

කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන ආයතනයක් වීම තුළ ආයතනයේ අධ්‍යයන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ දැඩි අධීක්ෂණයකට ලක්වේ. ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගත යුතු අධ්‍යයන කටයුතුවල උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ යහපත් සම්ප්‍රදායන් ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය බැඳී සිටී.

මානව සම්පත් අභිවර්ධන ආයතනය මූලිකවම ආරම්භ කරන ලද්දේ සියලුම කාණ්ඩවල සේවකයින්ට ඔවුන්ගේ කුසලතා, නායකත්ව ගුණාංග සහ ශ්‍රමිකයින් ලෙස ඔවුන්ගේ වගකීම් පිළිබඳ පිළිගන්නා ගුණාත්මකභාවයෙන් යුත් පෘථුල උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීම සඳහා පහසුකම් සැළසීමටය. එමගින් ඔවුන්ට තම සේවා ස්ථානයන්හි ඵලදායී දායකත්වයක් ලබා දීමට හැකි වූ අතර 1983 වනතෙක් ප්‍රදානය කරන ලද්දේ ශාස්ත්‍රවේදී උපාධියක් වශයෙනි. කෙසේ නමුත් 1986 දී ආයතනය ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය පිරිනැමීමට ආරම්භ කරන ලදී. 2007 වසරේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය එම අධ්‍යයන කටයුතු ව්‍යාප්ත කරන ලද අතර පශ්චාත් උපාධි පිරිනැමීමට අරම්භ කළේය. 2015 සහ 2016 වර්ෂවල ආයතනය එහි අධ්‍යයන වැඩසටහන් ප්‍රතිශෝධනය කළ අතර අධ්‍යයන වැඩසටහන් ප්‍රථම උපාධි පාඨමාලාව, පශ්චාත් උපාධි වැඩසටහන්, විධායක ඩිප්ලෝමාවන්, ඩිප්ලෝමා සහ සහතිකපත් වැඩසටහන් යන කාණ්ඩ 05 ක් යටතේ ඉදිරිපත් කිරීමට තීරණය විය. ඒ අනුව 2016 වසර තුළ උපාධි පාඨමාලාවක්, පශ්චාත් උපාධි පාඨමාලා 05 ක්, ඩිප්ලෝමා වැඩසටහන් 12 ක්, සහ සහතිකපත් වැඩසටහන් 11 ක් පවත්වන ලදී. (වගුව 1.1 2016 වසර තුළ මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන වැඩසටහන්)

2016 වසරේදී ඇතුළත් කර ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 7,233 කි. ප්‍රස්තාර අංක 02 මගින් ශිෂ්‍යයන්ගේ පුම්තිරිභාවය සහ පාඨමාලා කාණ්ඩය අනුව ශිෂ්‍ය සංඛ්‍යාව පෙන්නුම් කර ඇත.

**ශිෂ්‍ය ඇතුළත් කර ගැනීම් - 2016**




*මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2016, මා.ස.අ.ආ.*

අභියෝගාත්මක ගෝලීය තත්ත්වයන් හමුවේ මුහුණ දීම මෙන්ම අපගේ ජාතික සංවර්ධනයේ මානව පදනම ශක්තිමත් කිරීමට පරිණත, බුද්ධිමත් “දැනුම භාවිත කරන්නන්” ලෙස මානව සම්පත අභිවර්ධනය කිරීමට මානව සම්පත් අභිවර්ධන ආයතනය බලාපොරොත්තු වේ. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීම උදෙසා මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලයෙන් උරුම වී ඇති ධනාත්මක ශාස්ත්‍රීය සම්ප්‍රදායන් සහ උසස් ශාස්ත්‍රීය ප්‍රමිතීන් තහවුරු කර ගනිමින් විශාල පරිවර්තනයක් සිදු කරමින් සිටී. යහපාලනයේ ප්‍රමිතීන් සපුරාලීම, ආයතන අධ්‍යයන වැඩසටහන් සඳහා දේශීය හා ගෝලීය ප්‍රතිතන ලබා ගැනීම සහ එමගින් සමාජීය වගකීමකින් යුත් යහසේවක වෙළඳ නාමයක් ඇති රාජ්‍ය ආයතනයක් බවට පත්වීම මෙම පරිවර්තනයේ අරමුණ වේ.

## 6.1 2016 වර්ෂය තුළ මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන වැඩසටහන්

| අංකය | පාඨමාලාවේ නම |
|---|---|
| | **උපාධි වැඩසටහන** |
| 01 | ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය, ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමාව |
| | **පශ්චාත් උපාධි වැඩසටහන්** |
| 02 | ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව |
| 03 | මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව |
| 04 | සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව |
| 05 | භූ තොරතුරු විද්‍යාපති පාඨමාලාව |
| 06 | ආපදා විශ්ලේෂණ කළමනාකරණ හා පාලන විද්‍යාපති පාඨමාලාව |
| | **විධායක ඩිප්ලෝමා වැඩසටහන්** |
| 07 | මානව සම්පත් කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |

| | |
|---|---|
| 08 | සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |
| 09 | ආපදා විශ්ලේෂණ කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |
| 10 | ව්‍යාපෘති කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |
| 11 | සංචාරක ව්‍යාපාර සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |
| 12 | ශ්‍රව්‍ය- දෘශ්‍ය නිෂ්පාදන සහ මාධ්‍ය තාක්‍ෂණ උසස් ඩිප්ලෝමාව |
| | **ඩිප්ලෝමා වැඩසටහන්** |
| 13 | සේවා කළමනාකරණ ඩිප්ලෝමාව |
| 14 | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව |
| 15 | උපදේශන මනෝ විද්‍යා ඩිප්ලෝමාව |
| 16 | අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව |
| 17 | තොරතුරු තාක්‍ෂණවේදි කළමනාකරණ ඩිප්ලෝමාව |
| 18 | කළමනාකරණ ඩිප්ලෝමාව |
| | **සහතිකපත් පාඨමාලා** |
| 19 | ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව |
| 20 | ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව |
| 21 | ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව |
| 22 | කථන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව |
| 23 | පාසල් හැරයන්නන් සඳහා වූ කෙටි කාලීන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව |
| 24 | පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව |
| 25 | කළමනාකරණ සහතිකපත් පාඨමාලාව |
| 26 | දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික |
| 27 | දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම |
| 28 | ව්‍යාපාරික පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව |
| 29 | සි.සි.එන්.ඒ. පාඨමාලාව |

## 6.2 මානව සම්පත් අභිවර්ධන ආයතන කළමනාකරණය

මානව සම්පත් අභිවර්ධන ආයතන ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශය මත කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය අනුව උපකුලපති විසින් පූර්ණකාලීන අධ්‍යක්ෂවරයෙක් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂවරයා ආයතනයේ අධ්‍යයන සහ පරිපාලන පූර්ණ කාලීන ප්‍රධාන විධායක නිලධාරියා වේ.

අධ්‍යක්ෂවරයා ශාස්ත්‍රීය මණ්ඩලයේ සභාපතිවරයා වන අතර ආයතනික අධ්‍යයන කමිටුවේ නිලබලයෙන් පත් වූ නිලධාරියෙක් ද වේ. ඔහු ආයතනයේ ප්‍රධාන ගිණුම් නිලධාරියා වන අතර, ආයතනයේ ශික්ෂණය පවත්වාගෙන යාමේ වගකීම් දරන්නා ද වේ.

2015 අගෝස්තු 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි වසර තුනක කාලයක් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය කළමනාකරණ හා මූල්‍ය පීඨයේ කළමනාකරණ සහ සංවිධාන අධ්‍යයන අංශයේ සහාය මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා ආයතන අධ්‍යක්ෂවරයා ලෙස තේරී පත් විය.

ආයතන සංවිධාන සැකැස්ම පහත දක්වා ඇත.

## 6.3 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලන සංවිධාන ව්‍යුහය




ශාස්ත්‍රීය කමිටුව ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය ආයතනයේ අධ්‍යයන, පරිපාලන හා කළමනාකරණ කටයුතු පරිපාලනය හා අධීක්ෂණය කරනු ලබයි. එහි සාමාජිකයන් පහත දක්වා ඇත. 2016 වර්ෂය තුළ රැස්වීම් වාර 14 ක් පවත්වන ලදි.

## 6.4 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව

| | | |
|---|---|---|
| 01 | මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා | සභාපති |
| 02 | මහාචාර්ය අතුල රණසිංහ මහතා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 03 | මහාචාර්ය ඩබ්. චන්ද්‍රදාස මහතා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 04 | මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම මහතා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 05 | මහාචාර්ය කේ. ගුණවර්ධන මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 06 | මහාචාර්ය නයනි මෙලගොඩ මිය | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 07 | ආචාර්ය දිනුකා විජේතුංග මිය | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 08 | එච්.එම්.එන්. වරකාඋල්ල මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 09 | එන්. සෙල්වකුමාරන් මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 10 | ඩී.එම්.එස්. දසනායක මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 11 | කේ.ඒ. විමලේන්ද්‍රරාජා මහතා | මහා භාණ්ඩාගාර නියෝජිත |
| 12 | එම්.පී.පී. හේමකුමාර මහතා | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| 13 | කේ.පී. මාතොටආරච්චි මහත්මිය | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| 14 | බී.කේ.පී. අබේසූරිය මහත්මිය | අධ්‍යයන මණ්ඩල නියෝජිත |

ශාස්ත්‍රීය කමිටුව අධ්‍යයන මණ්ඩල 03 කින් සමන්විත වන අතර 2016 වසර තුළ අධ්‍යයන මණ්ඩල කමිටු රැස්වීම් 34 ක් පවත්වා ඇත. එහි සාමාජිකයන් පහත දක්වා ඇත.

- **මානව සම්පත් අධ්‍යාපන අධ්‍යයන කමිටුව (රැස්වීම් 13)**

| 01 | එම්.පී.පී. හේමකුමාර මහතා | සභාපති |
|---|---|---|
| 02 | මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා | සාමාජික (අධ්‍යක්ෂ/ මා.ස.අ.ආ.) |
| 03 | ආචාර්ය එන්.එන්.ජේ. නවරත්න මහතා | සාමාජික |
| 04 | කේ.පී. මාතොටආරච්චි මහත්මිය | සාමාජික |
| 05 | ආචාර්ය ඩී.ඒ.සී. සිල්වා මහතා | සාමාජික |
| 06 | ආචාර්ය එස්. කෝපරහේවා මහතා | සාමාජික |

- **ව්‍යාප්ති වැඩසටහන් අධ්‍යයන කමිටුව (රැස්වීම් 11)**

| 01 | කේ.පී. මාතොටආරච්චි මහත්මිය | සභාපති |
|---|---|---|
| 02 | මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා | සාමාජික (අධ්‍යක්ෂ/ මා.ස.අ.ආ.) |
| 03 | මහාචාර්ය එස්.ආර්.ඩී. රෝසා මහතා | සාමාජික |
| 04 | ආචාර්ය ආර්. ප්‍රේමසිරි මහතා | සාමාජික |
| 05 | කේ.ඩී.එන්. හේවගේ මහතා | සාමාජික |
| 06 | කේ. ගමගේ මහතා | සාමාජික |

- **භාෂා ඉගෙනුම් වැඩසටහන් අධ්‍යයන කමිටුව (රැස්වීම් 10)**

| 01 | බී.කේ.පී. අබේසූරිය මහත්මිය | සභාපති |
|---|---|---|
| 02 | මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා | සාමාජික (අධ්‍යක්‍ෂ/ මා.ස.අ.ආ.) |
| 03 | පී.ජේ.සී. සිල්වා මිය | සාමාජික |
| 04 | ඩබ් ඩබ් ඩී සිල්වා මහතා | සාමාජික |
| 05 | ඩබ් ජයවර්ධන මිය | සාමාජික |
| 06 | එච්.ඩී. ධර්මසේකර මයා | සාමාජික |
| 07 | ටී. සුරේන්ද්‍රන් මිය | සාමාජික |

ශාස්ත්‍රිය කමිටුව සඳහා කමිටු 5 ක් ඇතුළත් වේ. එහි සාමාජිකයන් පහත දැක්වේ.

- **විගණන කමිටුව (ස්වාධීන කමිටුවකි)**

| 01 | මහාචාර්ය ඩබ්. චන්ද්‍රදාස මහතා | සභාපති |
|---|---|---|
| 02 | මහාචාර්ය කේ. ගුණවර්ධන මහතා | සාමාජික |
| 03 | එච්.එම්.එන්. වරකාඋල්ල මහතා | සාමාජික |
| 04 | කේ.ඒ. විමලේන්ද්‍රරාජා මහතා | මහා භාණ්ඩාගාර නියෝජිත |

- **ප්‍රසම්පාදන කමිටුව**

| 01 | මහාචාර්ය ජේ ඒ එස් කේ ජයකොඩි මහතා | සභාපති (අධ්‍යක්‍ෂ/මා.ස.අ.ආ.) |
|---|---|---|
| 02 | එම්.පී.පී. හේමකුමාර මහතා | සාමාජික |
| 03 | ජේ.එස්.වී.එන්.ටී. සොයිසා මිය | සාමාජික |
| 04 | එච්.පී.ඩී. ශ්‍රියානි මෙය | සාමාජික |

- **මූල්‍ය කමිටුව**

| 01 | මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා | සභාපති (අධ්‍යක්‍ෂ/මා.ස.අ.ආ.) |
|---|---|---|
| 02 | ජේ.එස්.වී.එන්.ටී. සොයිසා මිය | සාමාජික (ලේකම්) |
| 03 | ආචාර්ය දිනුකා විජේතුංග මිය | සාමාජික |
| 04 | ඩී.එම්.එස්. දසනායක මහතා | සාමාජික |
| 05 | එම්.පී.පී. හේමකුමාර මහතා | සාමාජික |
| 06 | කේ.පී. මාතොටආරච්චි මහත්මිය | සාමාජික |
| 07 | බී.කේ.පී. අබේසූරිය මහත්මිය | සාමාජික |
| 08 | එච්.පී.ඩී. ශ්‍රියානි මෙය | සාමාජික |

- **පර්යේෂණ කළමනාකරණ කමිටුව**

| 01 | මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම මහතා | පීඨාධිපති/ විද්‍යා පීඨය |
|---|---|---|
| 02 | මහාචාර්ය ඩබ් චන්ද්‍රදාස මහතා | පීඨාධිපති/ අධ්‍යාපන පීඨය |
| 03 | මහාචාර්ය අතුල රණසිංහ මහතා | පීඨාධිපති/ ශාස්ත්‍ර පීඨය |

- **ගොඩනැඟිලි කමිටුව**

| 01 | මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා | සභාපති (අධ්‍යක්‍ෂ/මා.ස.අ.ආ.) |
|---|---|---|
| 02 | එච්.පී.ඩී. ශ්‍රියානි මෙය | සාමාජික |
| 03 | එච්.එම්.එන්. වරකාඋල්ල මහතා | සාමාජික |
| 04 | කේ.ඒ. විමලේන්ද්‍රරාජා මහතා | මහා භාණ්ඩාගාර නියෝජිත |

- **පුස්තකාල කමිටුව**

| 01 | මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා | සභාපති (අධ්‍යක්ෂ/මා.ස.අ.ආ.) |
|---|---|---|
| 02 | ආර්.එම්.එස්.එන්. රත්නායක මිය | සාමාජික (ලේකම්) |
| 03 | එම්.පී.පී. හේමකුමාර මහතා | සාමාජික |
| 04 | කේ.පී. මාතොටආරච්චි මහත්මිය | සාමාජික |
| 05 | කේ.ඩී.එන්. හේවගේ මහතා | සාමාජික |
| 06 | එස්. සත්‍යසීලන් මහතා | සාමාජික |
| 07 | ජේ.එස්.වී.එන්.ටී. සොයිසා මිය | සාමාජික |
| 08 | ඩී.සී. පෙරේරා මහත්මිය | සාමාජික |
| 09 | එච්.පී.ඩී. ශ්‍රියානි මෙය | සාමාජික |
| 10 | පී.බී.පී.ඩී. ද සිල්වා මහතා | සාමාජික |
| 11 | ඊ.එන්.සී. පෙරේරා මහතා | සාමාජික |
| 12 | වී.එන්.පී. ලියනගේ මහතා | සාමාජික |

## 7. 2016 වර්ෂය තුළ මා.ස.අ. ආයතනයේ කාර්ය සාධනය

### 7.1 අධ්‍යයන වැඩසටහන්

2016 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් අංක 06.1 සටහනේ දක්වන ලද අධ්‍යයන වැඩසටහන් 29 ක් පහත කාණ්ඩ 05 ක් යටතේ පවත්වන ලදි. ඒවා නම්:

1) උපාධි අධ්‍යයන වැඩසටහන
2) පශ්චාත් උපාධි වැඩසටහන්
3) විධායක ඩිප්ලෝමා වැඩසටහන්
4) ඩිප්ලෝමා වැඩසටහන්
5) සහතිකපත්‍ර වැඩසටහන්

#### 7.1.1 උපාධි අධ්‍යයන වැඩසටහන

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය වසර 36 ක් පුරා රාජ්‍ය භාණ්ඩාගාර අනුග්‍රහය මගින් පවත්වාගෙන යනු ලබන එකම අධ්‍යයන වැඩසටහන වේ. මෙම වැඩසටහන උපාධිය සහ ඩිප්ලෝමාව වශයෙන් ප්‍රධාන අංග දෙකකින් (02) සමන්විතය. උපාධි පාඨමාලාවේ කාලය වසර 03 ක් එනම්, අධ්‍යයන සෙමෙස්තර 06 කින් සමන්විතය. උපාධි පළමුවෙනි වසරට ඇතුළත් වීමට සුදුසුකම් නොමැති අය උපාධි පළමු වසර සඳහා බඳවා ගැනීමට අධ්‍යයන සෙමෙස්තර 02 කින් යුත් එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවත් ඊට අදාළ පරීක්ෂණත් සම්පූර්ණ කළ යුතුය. මෙම උපාධි සහ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ඇතුළත් වීම සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය යන දෙකම සමත් විය යුතුය.

2016 වර්ෂය තුළ මෙම අධ්‍යයන වැඩසටහ සඳහා අයදුම්කරුවෝ හාරසිය හැට හතක් (467) තෝරා ගැනීමේ පරීක්ෂණයට පෙනී සිටිය අතර ඉන් 42% ක් පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලදහ. එකසිය අනූ හතරක් (194) උපාධි අපේක්ෂක අයදුම්කරුවන් පාඨමාලාවට ලියාපදිංචි වූ අතර එය 2015 වසර හා සැසැඳීමේදී 23% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

ප්‍රස්තාර අංක 3 මගින් පෙන්වා ඇති පරිදි උපාධි වැඩසටහනේ පුරුෂ සංයුතිය 55% කි.




*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2016, මා.ස.අ.ආ)*

පාඨමාලා සමාරම්භක උත්සවය 2016 මැයි මස 29 වන දින කොළඹ විශ්වවිද්‍යාලයීය නව කලාගාරයේදී පැවැත්විණ. 2016 වසර තුළ අධ්‍යයන වැඩසටහනේ විවිධ මට්ටම්වල ලියාපදිංචි වූ සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 567 කි. 2012 වසරේ සිට මේ දක්වා වසර 5 ක කාල පරාසය තුළ සමස්ථ උපාධිලාභි උත්පාදන ප්‍රතිශතය 2016 වසරේදී 76.6% ක් ලෙස පෙන්නුම් කරන ලදි.

### 2012 - 2016 කාලය තුළ ශ්‍රම අධ්‍යාපනවේදි වැඩසටහනේ කාර්ය සාධනය

| වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | උපාධිධාරී/ සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[1] | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| ශ්‍රම අධ්‍යාපනවේදි උපාධිය | 221 | 189 | 137 | 157 | 194 | 112 | 153 | 153 | 119 | 124 |
| ශ්‍රම අධ්‍යාපනවේදි ඩිප්ලෝමාව | 54 | 55 | 59 | 51 | 54 | 37 | 49 | 37 | 42 | 32 |

### ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාවේ කාර්ය සාධනය : 2012 - 2016







*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2016, මා.ස.අ.ආ).*

### ශ්‍රම අධ්‍යාපනවේදි ඩිප්ලෝමා පාඨමාලාවේ කාර්ය සාධනය : 2012 - 2016







*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2016, මා.ස.අ.ආ).*

*[1] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලත් සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.*

### 7.1.2 පශ්චාත් උපාධි වැඩසටහන්

2016 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් විවිධ අධ්‍යයන පථයන් ආවරණය කරමින් පශ්චාත් උපාධි පාඨමාලා 05 ක් පවත්වන ලදි. මෙම වැඩසටහන්, කළමනාකරුවන්ට ඔවුන්ගේ විෂය පථයන් තුළ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම අරමුණු කොට ඇත. මානව සම්පත් අභිවර්ධන ආයතනය කළමනාකරණ අධ්‍යයනය ආශ්‍රිත පශ්චාත් උපාධි පාඨමාලා 03 ක් මෙහෙයවයි. කළමනාකරණ වෘත්තීන්හි යෙදී සිටින සිසුන්ට සියලු කළමනාකරණ ශික්ෂණ මුඛ්‍ය දැනුම හා අවබෝධය ලබා ගත හැක. එමෙන්ම ඉතා විශ්වාසයෙන් යුතුව ව්‍යාපාරික ගැටලු හමුවේ මුහුණ දීමටත් ගැටලු විසඳීම සඳහා අවශ්‍ය සංකල්පමය සහ විශ්ලේෂණාත්මක මෙවලම් සම්පාදනය කිරීමත් මෙමගින් සිදු කෙරේ.

භූතොරතුරු සහ ආපදා කළමනාකරණ විශ්ලේෂණ හා පාලන යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විද්‍යාපති පාඨමාලාවන් දෙකක් ආයතනය විසින් පවත්වන ලදි. මෙම වැඩසටහන් සැලසුම් කර ඇත්තේ භූතොරතුරු සහ ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයන්හි එම අදාළ අංශවල තක්සේරු කිරීම්, අධීක්ෂණය, ඇගයීම සහ සම්පත් කළමනාකරණයේ විශේෂඥභාවය ලබා දීමටයි. නූතන විද්‍යාත්මක විෂයක් ලෙස භූතොරතුරු විද්‍යාපති පාඨමාලාව සඳහා ඇති ඉල්ලුම තරමක් වැඩි වී ඇත. 2016 වසරේ දී අයදුම්කරුවන් 141 ක් පාඨමාලාව සඳහා අයදුම් කළ අතර තරගකාරී සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව අපේක්ෂකයින් 83 ක් පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීය.

මාර්තු මාසයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි විද්වතුන් සහ විශේෂඥයින්ගේ සහභාගිත්වය ඇතිව වෙළඳපොළ අවශ්‍යතාවයන්ට අනුව එක් එක් වැඩසටහනේ විෂයමාලාව සංශෝධනය කිරීම උදෙසා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධන වැඩසටහනක් පවත්වන ලදි. එම වැඩසටහනේ ප්‍රතිඵලයක් ලෙස ආපදා විශ්ලේෂණ කළමනාකරණ සහ පාලන විද්‍යාපති පාඨමාලාවේ ශිෂ්‍ය ලියාපදිංචිය 2016 වසරේදී තාවකාලිකව නතර කරන ලදි.




*මූලාශ්‍රය: සම්පිණ්ඩිත දත්ත, 2012-2016, මා.ස.අ.ආ.*

පශ්චාත් උපාධි පාඨමාලා 04 ක් සඳහා වෘත්තිකයන් 277 ක් ලියාපදිංචි වූ අතර වැඩිම ශිෂ්‍ය ලියාපදිංචිය භූතොරතුරු විද්‍යාපති පාඨමාලාවෙන් සටහන් විය. පශ්චාත් උපාධිලාභී නිමැවුම 2012 සිට 2016 දක්වා කාලය තුළ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරයි.

ස්ත්‍රී-පුරුෂ සංයුතිය සැලකීමේදී පුරුෂ සංඛ්‍යාව ස්ත්‍රී සංඛ්‍යාවට වඩා වැඩි අගයක් පෙන්නුම් කෙරිණ. එය ස්ත්‍රී 39% කට පුරුෂයින් 61% ක් වශයෙනි.

2015 වර්ෂය සඳහා වූ පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය 2016 දෙසැම්බර් මස 06 වන දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදි. එහිදී මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වන ලද පශ්චාත් උපාධි පාඨමාලා 5 කින් පශ්චාත් උපාධිලාභීන් 245 ක් උපාධි ලබන ලදි.

## 2012 - 2016 කාලය තුළ පශ්චාත් උපාධි වැඩසටහන්වල ශිෂ්‍ය කාර්ය සාධනය

| අංකය | වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | උපාධිධාරී ශිෂ්‍ය සංඛ්‍යාව[2] | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| 01 | ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය | 104 | 162 | 160 | 172 | 61 | - | - | 77 | 87 | - |
| 02 | මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධිය | 181 | 173 | 146 | 135 | 67 | 64 | 64 | 113 | 85 | 93 |
| 03 | සේවා කළමනාකරණ විද්‍යාපති උපාධිය | 114 | - | 112 | 121 | 66 | - | - | - | 43 | 88 |
| 04 | භූ විද්‍යා තොරතුරු විද්‍යාපති උපාධිය | 44 | 50 | 51 | - | 83 | - | 11 | 07 | 07 | 62 |
| 05 | ආපදා විශ්ලේෂණ කළමනාකරණ සහ පාලන විද්‍යාපති උපාධිය | - | 65 | 50 | - | - | - | - | - | 25 | 26 |
| | එකතුව | 443 | 450 | 519 | 428 | 277 | 64 | 75 | 197 | 247 | 269 |

### මා.ස.අ. ආයතනයේ පශ්චාත් උපාධි වැඩසටහන්වල කාර්ය සාධනය : 2012 - 2016







*මූලාශ්‍රය: සම්ක්ෂිත දත්ත, 2012-2016, මා.ස.අ.ආ.*

### 7.1.3 විධායක ඩිප්ලෝමා වැඩසටහන්

දිවයින පුරා සිටින වෘත්තිකයන්ට ඔවුන්ගේ වෘත්තිය විෂය ක්ෂේත්‍රයන්හි විෂය ප්‍රාගුණ්‍ය සුදුසුකම් ලබා ගැනීමට විධායක ඩිප්ලෝමාවන් ඉතාමත් සුදුසු වේ. රැකියා ක්ෂේත්‍රය තුළ මධ්‍යම මට්ටමේ වෘත්තිකයන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් නිර්මාණය කොට ඇත. මෙම වැඩසටහන්වල මූලික අරමුණ වන්නේ කළමනාකරණ වෘත්තිකයන්ට ඔවුන් නියුක්ත වන සේවා අංශයන්හි විශේෂිත දැනුම වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසීමයි.

එමෙන්ම, විධායක ඩිප්ලෝමා පාඨමාලාවන් පුද්ගල සංවර්ධනය කේන්ද්‍ර කොටගෙන ඇත්තේ සහභාගිවන්නන් ඔවුන්ගේ ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීමේදී පදනමක් ලෙස තම හැසිරීම් රටාවන් අභියෝගයට ලක් කිරීමේ පෞද්ගලික අත්දැකීමක් ඔවුන්ට අත්‍යාවශ්‍යවන බවට තිබෙන ස්ථිරසාර විශ්වාසය මත පදනම්වය.

2015 සහ 2016 වර්ෂ සන්සන්දනය කිරීමේදී, 2016 වසර තුළ ශිෂ්‍ය ලියාපදිංචිය 52% ක පමණ අඩුවීමක් පෙන්නුම් කළේය. කෙසේවෙතත්, පවත්වන ලද පාඨමාලා 6 කින් 2016 වසරේදී 66% ක් පමණ සිසුහු පිරිසක් විධායක ඩිප්ලෝමා සුදුසුකම් ලදහ. ආපදා විශ්ලේෂණ කළමනාකරණ විධායක ඩිප්ලෝමාව සහ ශ්‍රව්‍ය- දෘශ්‍ය නිෂ්පාදන සහ මාධ්‍ය තාක්ෂණ උසස් ඩිප්ලෝමාව යන අධ්‍යයන වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණින් නවතා දැමීමට කටයුතු කෙරිණ.

*[2] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලත් සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.*

**මා.ස.අ. ආයතනයේ 2012 - 2016 කාලය තුළ විධායක ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනය**

| අංකය | වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[3] | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| 01 | මානව සම්පත් කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 75 | 68 | 97 | 113 | 35 | 40 | 38 | 34 | 61 | 81 |
| 02 | ව්‍යාපෘති කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | - | 29 | - | 31 | - | - | - | - | 13 | - |
| 03 | ආපදා විශ්ලේෂණ කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | - | 45 | 43 | - | - | - | - | 25 | - | 23 |
| 04 | සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව | 35 | 81 | 83 | 94 | 107 | - | 62 | 50 | 59 | 51 |
| 05 | ශ්‍රව්‍ය-දෘශ්‍ය නිෂ්පාදන සහ මාධ්‍ය තාක්ෂණ උසස් ඩිප්ලෝමාව | - | - | 38 | - | - | - | - | - | - | 12 |
| 06 | සංචාරක ව්‍යාපාර සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | - | - | - | 35 | - | - | - | - | - | 34 |
| | එකතුව | 110 | 223 | 261 | 273 | 142 | 40 | 100 | 109 | 133 | 201 |

**මා.ස.අ. ආයතනයේ විධායක ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනයඃ 2012 - 2016**







*මූලාශ්‍රය: සම්ක්ෂිත දත්ත, 2012-2016, මා.ස.අ.ආ.*

### 7.1.4 ඩිප්ලෝමා වැඩසටහන්

මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් වර්ග තුනක් යටතේ ඩිප්ලෝමා පාඨමාලා මෙහෙයවනු ලබයි. එය කළමනාකරණය, මානව ශාස්ත්‍ර සහ භාෂා වැඩසටහනකින් සමන්විත වේ. මෙම වැඩසටහන් මූලික, ද්විතියික මට්ටමේ රැකියා නියුක්තිකයන්ට ඔවුන්ගේ වෘත්තිය ජීවිතය තුළ තමන්ගේ දැනුම, විශ්ලේෂණාත්මක චින්තනය, හැකියා ඔප්නැංවීම, සදාචාරාත්මක ප්‍රමිතීන්, නායකත්වය සහ වගකීම් දැරීමේ හැකියා වර්ධනය කිරීම අරමුණු කොට ගෙන නිර්මාණය කොට ඇත. විවිධාකාර වූ සිසුන්ට ඔවුන්ගේ විවිධ වූ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට මෙම ඩිප්ලෝමාවන් රැකුලක් වේ. ඇතැම් විට ඒවා අධ්‍යයන කටයුතුවල විවිධ අවධීන් අතර ඇති පරතරය දුරලීම සඳහාත් අමතර වෘත්තිය පුහුණුවක් සහ සුදුසුකම් ලබා ගැනීමටත් පාලමක් ලෙස මෙහෙවර කරනු ලබයි. ඩිප්ලෝමා පාඨමාලාවකට වටිනා විශේෂිත කුසලතා, දැනුම සහ අත්දැකීම් සම්පාදනය කළ හැක.

බාහිර පාර්ශවයන් සමග සහයෝගීව දියත් කරන ලද ඇතැම් අධ්‍යයන පාඨමාලා ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් වසර තුළදී තාවකාලිකව නවත්වනු ලැබීය. එම නිසා 2016 වර්ෂයේ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව 54% කින් පමණ අඩුවිය. 2016 වසර තුළ සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචිය 178 කි. ශිෂ්‍ය ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 28% ක් පුරුෂයින් වූ අතර ස්ත්‍රීන් 84% ක බහුතර ශිෂ්‍ය ලියාපදිංචියක් පෙන්නුම් කළහ.

*[3] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.*

### මා.ස.අ. ආයතනයේ 2012 - 2016 කාලය තුළ ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනය

| අංකය | වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[4] | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| 01 | සේවා කළමනාකරණ ඩිප්ලෝමාව | 105 | - | 74 | 58 | 20 | - | - | 64 | 23 | 37 |
| 02 | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව | - | 44 | - | 50 | - | - | 11 | 25 | - | - |
| 03 | උපදේශන මනෝ විද්‍යා ඩිප්ලෝමාව | 30 | 25 | 50 | 34 | - | - | 28 | 25 | 36 | 23 |
| 04 | අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව | 139 | 120 | 120 | 163 | 124 | 91 | 96 | - | 124 | 123 |
| 05 | තොරතුරු තාක්‍ෂණවේදී කළමනාකරණ ඩිප්ලෝමාව | - | - | 57 | - | - | - | - | 25 | 10 | 13 |
| 06 | කළමනාකරණ ඩිප්ලෝමාව | - | - | - | 22 | 34 | - | - | - | 11 | 10 |
| | එකතුව | 274 | 189 | 301 | 327 | 178 | 91 | 135 | 139 | 204 | 206 |

### ඩිප්ලෝමා වැඩසටහන්වල ශිෂ්‍ය කාර්ය සාධනය : 2012 - 2016







*මූලාශ්‍රය: සම්ක්ෂිත දත්ත, 2012-2016, මා.ස.අ.ආ.*

### 7.1.5 සහතිකපත්‍ර වැඩසටහන්

මානව සම්පත් අභිවර්ධන ආයතනය වෘත්තිමය සංවර්ධනයක් කරා ප්‍රවේශ වීමට අධ්‍යයනයේ නියුක්ත ශිෂ්‍යයින් පුහුණු කිරීම සඳහා විවිධ වූ විෂය ක්ෂේත්‍රයන්හි සහතිකපත් වැඩසටහන් ප්‍රදානය කරනු ලබයි. 2016 වසර තුළ සහතිකපත්‍ර පාඨමාලාවන් 11 ක් පැවැත්විණ. මානව සම්පත් අභිවර්ධන ආයතනය ඉංග්‍රීසි භාෂා පාඨමාලාවන් වසර 30 කට වඩා කාලයක් පුරා පවත්වාගෙන යයි. ඉන් 05 ක් විවිධ මට්ටම් සඳහා වූ ඉංග්‍රීසි භාෂා පාඨමාලා විය. සහතිකපත් වැඩසටහන් සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 84% ක්ම ලියාපදිංචි වී ඇත්තේ ඉංග්‍රීසි භාෂා පාඨමාලා සඳහාවේ. ඊට අමතරව, දමිළ භාෂා පාඨමාලාවක්, කළමනාකරණ පාඨමාලාවක් සහ තොරතුරු තාක්ෂණවේදී පාඨමාලා 02 ක් පවත්වන ලදී. 2016 වසර තුළ ලියාපදිංචි වී ඇති සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 6388 ක් වන අතර ඉන් 64% ක් ශිෂ්‍යාවන්වේ.

*[4] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.*

### 2012 - 2016 කාලය තුළ සහතිකපත්‍ර වැඩසටහන්වල කාර්ය සාධනය

| අංකය | වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[5] | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| 01 | ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව | 2986 | 2737 | 2206 | 2149 | 1321 | 2737 | 2392 | 1665 | 1688 | - |
| 02 | ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව | 340 | 141 | 259 | 187 | 217 | 225 | 229 | 132 | 120 | - |
| 03 | ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව | 112 | 74 | 99 | 99 | 67 | 105 | 71 | 67 | 62 | - |
| 04 | කථන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව | 740 | 570 | 1707 | 1705 | 3637 | 325 | 540 | 544 | 1261 | 2706 |
| 05 | පාසල් හැරයන්නන් සඳහා වූ කෙටි කාලීන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව | - | 60 | 215 | 251 | 130 | - | - | 45 | 314 | - |
| 06 | පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව | 230 | 471 | 549 | 354 | 452 | - | 167 | 213 | 246 | 320 |
| 07 | කළමනාකරණ සහතිකපත් පාඨමාලාව | 32 | 20 | 92 | 59 | - | 19 | 12 | 11 | 54 | 41 |
| 08 | දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික | 634 | 749 | 658 | 316 | 341 | 444 | 503 | - | 411 | 242 |
| 09 | දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම | 301 | 251 | 322 | 262 | 160 | 147 | 197 | - | 200 | 159 |
| 10 | ව්‍යාපාරික පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව | - | 452 | - | 1051 | - | - | 392 | - | 579 | 245 |
| 11 | සී.සී.එන්.ඒ. පාඨමාලාව | - | 98 | 103 | 37 | 63 | - | 48 | 14 | 31 | 35 |
| | එකතුව | 5375 | 5623 | 6210 | 6470 | 6388 | 4002 | 4551 | 2691 | 4966 | 3748 |

### මා.ස.අ. ආයතනයේ සහතිකපත්‍ර වැඩසටහන්වල ශිෂ්‍ය කාර්ය සාධනය : 2012 - 2016







*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2012-2016, මා.ස.අ.ආ.*

## 7.2 2016 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩමුළු විස්තර

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පශ්චාත් උපාධි, උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලා හදාරන සිසුන්ට ඔවුන් අදාළ අධ්‍යයන වැඩසටහනේ අනිවාර්ය අංගයක් ලෙස වැඩමුළුවකට සහභාගි විය යුතුය. මෙම වැඩසටහන්වල අරමුණ ශිෂ්‍යයින්ගේ වෘත්තිමය සංවර්ධනයයි.

*[5] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.*

දේශනවල මෙන් නොව, වැඩමුළු මගින් වෘත්තිය ලෝකයට අදාල මාතෘකා පිළිබඳ විවෘතව සාකච්ජා කිරීම සහ නව අදහස් ඉදිරිපත් කිරීමට සංවාදාත්මක සාකච්ජා සඳහා දිරිගන්වනු ලබයි. සහභාගිවන්නන්ට ගැටලු හමුවේ මුහුණ දීමේදී ගැටලු නිරාකරණයට ඔවුන්ගේ දෘෂ්ටිය අනුව ගැටලු විසඳා ගන්නේ කෙසේද යන්න පිළිබඳව අදහස් හුවමාරු කර ගත හැක. සිසුන්ට ඉදිරියට යාමට හැකි නව නිපුණතා වර්ධනය කර ගැනීමට වැඩමුළු මගින් උපකාර වන අතර තම ඉදිරිපත් කිරීමේ හැකියාවන් වැඩි දියුණු කර ගැනීමට, නායකත්වය, සන්නිවේදනය සහ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය වැනි හැකියාවන් සංවර්ධනය කර ගැනීමට ද එමගින් හැකියාව ලැබේ.

- **මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද වැඩමුළු**

2016 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පශ්චාත් උපාධි, උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලාවන්හි ඉගෙනුම ලබන සිසුන් සඳහා දැනුම, කුසලතා, ශිෂ්‍ය මෙන්ම රාජ්‍ය/ පෞද්ගලික අංශ සේවක ආකල්ප වැඩි දියුණු කිරීම අරමුණ ඇතිව පුහුණු වැඩමුළු 18 ක් පමණ පවත්වන ලදි.

### 7.2.1 මානව සම්පත් කළමනාකරණ අංශය විසින් පවත්වන ලද වැඩමුළු

2016 වසරේදී මානව සම්පත් කළමනාකරණ වැඩසටහන් අංශය විසින් ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි (MBM) සහ මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි (MHRM) වැඩසටහන් සඳහා වැඩමුළු 07 ක් පවත්වන ලදි. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පවතින ඉඩ පහසුකම් මදබව හේතු කොටගෙන මෙම වැඩමුළු හලාවත පිළිගත් හෝටල්වලදී පවත්වන ලැබිණ.



| වැඩසටහන | දිනය/ දින | මාතෘකාව | සහභාගි වූ ශිෂ්‍ය සඛ්‍යාව |
|---|---|---|---|
| ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය | 2016 පෙබරවාරි 06, 07, 13 සහ 14 | කළමනාකරණ මූලධර්ම | 142 |
| මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධිය | 2016 මැයි 13, 14 සහ 15 | පුද්ගල සංවිධාන කළමනාකරණය | 120 |
| ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය සහ මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධිය | 2016 ජුලි 17, 18 සහ 19 | මානව සම්පත් කළමනාකරණය | 240 |
| ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය | 2016 අගෝසතු 28 සහ 29 | මානව සම්පත් කළමනාකරණය | 72 |
| ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය | 2016 සැප්තැම්බර් 04 සහ 05 | මානව සම්පත් කළමනාකරණය | 65 |
| මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධිය | 2016 දෙසැම්බර් 04, 05, 11 සහ 12 | පුද්ගල සංවිධාන කළමනාකරණය | 63 |
| ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය | 2016 දෙසැම්බර් 04, 05, 11 සහ 12 | කළමනාකරණ මූලධර්ම | 58 |
| **ශ්‍රම අධ්‍යාපනවේදි උපාධිය - ප්‍රථම භාගය** | 2016 නොවැම්බර් 26 සහ 27 | කළමනාකරණ මූලිකාංග | 154 |
| | | **සමස්ත සහභාගිත්වය** | **914** |

*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2016, මා.ස.අ.ආ.*

### 7.2.2 සේවා කළමනාකරණ වැඩසටහන් අංශය විසින් පවත්වන ලද වැඩමුළු





සේවා කළමනාකරණ වැඩසටහන් අංශය විසින් සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව හදාරන සිසුන් සඳහා එළිමහන් පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදි. මෙම වැඩමුළු සඳහා සහභාගි වූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව එකසිය පනස් දෙකක් (152) වේ. මෙම වැඩසටහන කේන්ද්‍ර ගත කොට ඇත්තේ සන්නිවේදනයේ සිට එකිනෙකට වෙනස් වටපිටාවක සේවය කිරීම, මානසික සංවේදිතාව වර්ධනය, නිර්මාණාත්මක මෙන්ම තිරණාත්මක තිරණ ගැනීම, සේවය කරන ආකාරය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම සහ මිනිසුන් සමඟ කටයුතු කරන්නේ කෙසේද සහ තමා තුළ මෙන්ම අනෙක් අතය තුළ ද ඇති වන ආතතිය සහ ගැටුම් නිරාකරණය කර ගැනිමට අවශ්‍ය වන්නා වූ විවිධාකාර මෘදු කුසලතා සංවර්ධනය කිරීමටයි. මෙහි එක් වැඩසටහනක් 2016 ජනවාරි 30 සහ 31 දිනවලදි 62 කගේ සහභාගිත්වයෙන් කලුතර ජිනසේන පුහුණු මධ්‍යස්ථානයේදි පවත්වන ලද අතර අනෙක් වැඩසටහන එම ආයතනයේම පෙබරවාරි මස 27 සහ 28 යන දිනවලදි 90 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි.

### 7.2.3 ව්‍යාප්ති වැඩසටහන් අංශය විසින් පවත්වන ලද වැඩමුළු

| ස්ථානය | වැඩසටහන | දින | මාතෘකාව | සහභාගි වූ ශිෂ්‍ය සඛ්‍යාව |
|---|---|---|---|---|
| **කිතුල්ගල** | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව | 2016 නොවැම්බර් 05 සහ 06 | ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | 33 |
| **පොල්ගොල්ල** | උපදේශන මනෝවිද්‍යා ඩිප්ලෝමාව | 2016 මාර්තු 03, 04 සහ 05 | ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | 54 |
| | | | **සමස්ත සහභාගිත්වය** | 87 |

*මූලාශ්‍රය: සම්ක්ෂිත දත්ත, 2016, මා.ස.අ.ආ.*

### 7.2.4 පුස්තකාලය විසින් පවත්වන ලද වැඩමුළු

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවා යෝජකයින් සහ සේවකයින් සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතන පුස්තකාලය විසින් වැඩමුළු 06 ක් පවත්වන ලදි. ආකල්ප සහ නිපුණතා සංවර්ධනය යන තේමාව යටතේ මෙම වැඩසටහන් පැවැත්විණ. ආකල්ප යනු සාර්ථකත්වයේ ප්‍රධාන අංගයකි. සහභාගිවූවන්ගේ වැඩිදුර ඉල්ලීමක් අනුව එහි තවත් වැඩසටහන් මාලාවක් ආකල්ප සහ නිපුණතා සංවර්ධන උසස් වැඩසටහන නමින් පවත්වන ලදි.



කෙටි කාලීන කාර්යසාධනයේ අභියෝගයන් සහ දිගුකාලීන සාර්ථකත්වය සඳහා තිරසාර කුසලතාවන් අත්පත් කර ගැනීම සඳහා සහභාගිවන්නන් නැවතත් ශක්තිමත් වී ඇති අතර, ඔවුන්ගේ වෘත්තීය සහ ජීවන කුසලතා ඕනෑම වෘත්තියක, පෞද්ගලික හා කුටුම්භ තත්ත්වයන්හි සාර්ථකත්වයේ නිපුණතා සංවර්ධනය කිරීමට අවස්ථාවක් ලැබුණි. විශ්වවිද්‍යාල භූමියේදි වැඩසටහන් 05 ක් පවත්වන ලද අතර බොරලැස්ගමුව හෙල්ප්-ඒජ් (Help-Age) ආයතනයේදි එක් වැඩසටහනක් පවත්වන ලදි.

| දින | මාතෘකාව | සහභාගි වූ ශිෂ්‍ය සඛ්‍යාව |
|---|---|---|
| 2016 පෙබරවාරි 03 | ආකල්ප සහ නිපුණතා සංවර්ධනය | 35 |
| 2016 අප්‍රේල් 29 | ආකල්ප සහ නිපුණතා සංවර්ධනය | 51 |
| 2016 ජුනි 24 | ආකල්ප සහ නිපුණතා සංවර්ධනය | 31 |
| 2016 පෙබරවාරි 12 | ආකල්ප සහ නිපුණතා සංවර්ධන උසස් වැඩසටහන | 51 |
| 2016 ජුනි 10 | ආකල්ප සහ නිපුණතා සංවර්ධන උසස් වැඩසටහන | 51 |
| 2016 මාර්තු 23 සහ 24 | ආකල්ප සහ නිපුණතා සංවර්ධන උසස් වැඩසටහන | 50 |
| | **සමස්ත සහභාගිත්වය** | 269 |

*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2016, මා.ස.අ.ආ.*

### 7.2.5 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළු

| වැඩසටහන | නම/ සහභාගිවන්නාගේ වෘත්තිමය තත්ත්වය | කාලසීමාව | සේවා සම්පාදනය |
|---|---|---|---|
| Preparation of Organizational Results Framework for State Owned Enterprises - Training Workshop | කේ. පී. මාතොටආරච්චි මිය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - ශ්‍රේණිය II<br><br>ජේ.එස්.වී.එන්.ටී. සොයිසා මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී<br><br>ඩබ්.ඩී.එන්. අසංගිකා මෙන.<br>විද්‍යාත්මක සහකාර - ශ්‍රේණිය II | 2016 ජුනි 03 | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය, කොළඹ 01 |
| Workshop on Preparation of Fixed Assets Register (FAR) of HEIs | එස්. සත්‍යසීලන් මයා<br>නියෝජ්‍ය ලේඛකාධිකාරී<br><br>ජේ.එස්.වී.එන්.ටී. සොයිසා මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | 2016 ජුනි 17 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, කොළඹ 07 |
| Establishing a Youth Movement against Corruption (Y-MaC) | පී.බී.පී.ඩී. ද සිල්වා මයා<br>තොරතුරු තාක්ෂණවේදි උපදේශක<br><br>ඩබ්.ඩී.එන්. අසංගිකා මෙන.<br>විද්‍යාත්මක සහකාර - ශ්‍රේණිය II | 2016 ඔක්තෝබර් 19 | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව, කොළඹ 07 |
| Certificate Course in English for Employment Purposes (CEEP) | ජේ.ඒ.ඩී. ගීතිකා මිය<br>පරිගණක යෙදවුම් සහකාර - ශ්‍රේණිය II | 2016 ජනවාරි 17 - අප්‍රේල් 10 | ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය (SLIDA) |

*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2016, මා.ස.අ.ආ.*

## 7.3 පර්යේෂණ, නව්‍යජනන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| පර්යේෂකයාගේ නම | මාතෘකාව (නිබන්ධය ඉංග්‍රීසි බසින් සිදු කෙරේ.) | දිනය | ස්ථානය/ප්‍රකාශනය |
|---|---|---|---|
| මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා | Charisma as a Follower-centric, Cognitive-affective Phenomenon: Initial Qualitative Evidence for the Cognitive Dimension | 2016 | ව්‍යාපාර කළමනාකරණ ජාතික පාසල් (NSBM) කළමනාකරණ ජර්නලය |
| මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා, ආචාර්ය පී කෛලාසපති මහත්මිය, ජේ. සුතා | Integrated theoretical model for employees' intention to participate in non-mandatory trainings | 2016 | ව්‍යාපාර සහ කළමනාකරණ අන්තර්ජාතික ජර්නලය |
| ඩබ්. එස්. චන්ද්‍රසේකර මයා | Students' Attitudes towards seeking help for their mental health difficulties | 19th & 20th August, 2016 | ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 'Managing Systems from source to sink: current theories and applications' - වයඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව |
| | Help seeking Attitutdes towards Mental Health Problems and Actual Help Seeking Behavior | 2016 | සමාජ විද්‍යා හා කළමනාකරණ පර්යේෂණ ජර්නලය (RJSSM) වෙළුම 5, අංක. 09 පිටු අංක 45-53 |
| | Help seeking Attitutdes and willingness to seek psycological help: Application of the theory of planned behavior | 2016 | කළමනාකරණ, ගණකාධිකරණ සහ ආර්ථික විද්‍යා අන්තර්ජාතික ජර්නලය (IJMAE), වෙළුම 3, අංක. 04, පිටු අංක 233 - 245 |
| ඩබ්. එස්. චන්ද්‍රසේකර මයා සහ වෙන්. ක්ෂි-ක්ෂියා මයා | The Psycological Mechanism of Stigmatizing Attitudes toward Help seeking Behavior for Mental Health Problems | 2016 | කළමනාකරණ, ගණකාධිකරණ සහ ආර්ථික විද්‍යා අන්තර්ජාතික ජර්නලය (IJMAE), වෙළුම 3, අංක. 11 |
| එම්.පී.පී. හේමකුමාර මයා | Study on the Knowledge Management of Indigenous Doctors in Sri Lanka | සැකසෙමින් පවති | - |
| කේ.ඩී.එන්. හේවගේ මයා | Mathematical modeling for forecasting and prediction for lightning | සැකසෙමින් පවති | - |
| කේ.පී. මාතොටආරච්චි මිය | The Impact or Organization Politics on Ethical Leadership in the Service Organization | සැකසෙමින් පවති | - |
| ආර්.එම්.එස්.එන්. රත්නායක මිය | සතුරාට මෛත්‍රී කිරීමට යෝජනා කරන අෂාඩි පුෂ්පය සහ සෞම්‍යාලෝකය | 2016 | නිරීක්ෂණ: එම්.එම්ජේ. මාරසිංහ උපහාර සංග්‍රහය, පිටු අංක 242 - 278 |
| | Impact of Electronic Media on Reading Habits of Teenagers in Sri Lanka | සැකසෙමින් පවති | - |
| ඩී.සී. පෙරේරා මිය | Disciplinary focus of Bachelor in Labour Education Programme and Career Progress of Bachelor of Labour Education | සැකසෙමින් පවති | - |

*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2016, මා.ස.අ.ආ.*

## 8. අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහාය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු

| සේවා කාණ්ඩය | තනතුරු නාමය | වැටුප් පරිමාණය | සේවා පදනම | පුම්තිරිභාවය | |
|---|---|---|---|---|---|
| | | | | පුරුෂ | ස්ත්‍රී |
| අධ්‍යයන | අධ්‍යක්ෂ/මා.ස.අ.ආ. | U-AC5 (II) | ස්ථිර | 1 | - |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය-ශ්‍රේණිය I | U-AC 3(I) | | 1 | - |
| | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය -ශ්‍රේණිය II | U-AC 3(II) | | - | 1 |
| | කථිකාචාර්ය (පරිවාස) | U-AC 3(IV) | | 2 | 1 |
| පුස්තකාල සේවා | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති | U-AC 3(I) | | - | 1 |
| පරිපාලන හා මූල්‍ය | නියෝජ්‍ය ලේඛකාධිකාරී | U-EX-2 (I) | | 1 | - |
| | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | U-EX-2 (II) | | - | 1 |
| | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | U-EX-2 (II) | | - | 1 |
| | සහකාර ලේඛකාධිකාරී | U-EX-1 (II) | | - | 1 |
| අධ්‍යයන සහාය | තොරතුරු තාක්ෂණවේදි උපදේශක -ශ්‍රේණිය II | U-AS 2 (I) | | 1 | - |
| | විද්‍යාත්මක සහකාර - ශ්‍රේණිය II | U-AS 1 (I) | | - | 1 |
| ලිපිකරු හා අනුබද්ධිත සේවා | ජ්‍යේ. මාණ්ඩලික සහකාර (ලඝුලේඛක) | U-MN-4(I) | | - | 1 |
| | ජ්‍යේ. මාණ්ඩලික සහකාර (ලිපිකරු) | U-MN-4(I) | | 1 | 3 |
| | මාණ්ඩලික සහකාර (ලිපිකරු) | U-MN-4(II) | | - | 2 |
| | පොත් තබන්නා - ශ්‍රේණිය I | U-MN-1(I) | | 1 | - |
| | පරිගණක යෙදවුම් සහකාර-ශ්‍රේණිය II | U-MN-1(I) | | - | 2 |
| මූලික | කම්කරු - වි. ශ්‍රේණිය | U-PL-1(Spl) | | 1 | - |
| | රියදුරු - වි. ශ්‍රේණිය | U-PL-3(Sp) | | 1 | - |
| | බයිසිකල් පණිවිඩකරු | U-PL-3(I) | | 1 | - |
| | පුස්තකාල සහායක - ශ්‍රේණිය II | U-PL-3(I) | | 1 | - |
| | කම්කරු - ශ්‍රේණිය II | U-PL-1(I) | | 1 | - |
| | කම්කරු - ශ්‍රේණිය III | U-PL-1(II) | | 2 | - |
| | රියදුරු - ශ්‍රේණිය III (පරිවාස) | U-PL3(III) | | 1 | - |
| | අධ්‍යයන සමායෝජක | U-AC 3(II) | පැවරුම් | 1 | - |
| | අධ්‍යයන සමායෝජක | - | | - | 2 |
| | සම්බන්ධීකාරක | - | | 1 | |
| | උපදේශක සහ පුහුණුකරු | - | | 1 | |
| | වැඩසටහන් සහකාර | - | | 9 | 24 |
| | කාර්යාල සහායක | - | | 2 | |
| | සනීපාරක්ෂක | - | | | 1 |
| **එකතුව** | | | | 30 | 42 |

## 9. පුස්තකාලය

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පුස්තකාලය ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ විධායක පාඨමාලාව, ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, සේවා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව, සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව සහ සේවා කළමනාකරණ විද්‍යාපති (සිංහල සහ ඉංග්‍රීසි) පාඨමාලාවන් හදාරන ශිෂ්‍යයින්ට ඇති මූඛ්‍ය සම්පත් දායකයෙකි. එය ග්‍රන්ථ 23, 000 කින් පමණ යුක්ත වේ. මානව සම්පත් අභිවර්ධන කාර්ය මණ්ඩලයට ද ඔවුන්ගේ දැනුම දියුණු කර ගැනීම උදෙසා පුස්තකාල පහසුකම් ලබා දී ඇත.

2015 වසරේදි රු. 162,897/- ක වියදමින් පුස්තකාලය සඳහා නව පොත් 352 ක් මිලදී ගෙන ඇති අතර තවත් පොත් 28 ක් ආධාර වශයෙන් ලැබී තිබේ. ආයතනය 2016 වසරේදි වාර සඟරා මිලදී ගැනීම සඳහා රුපියල් 79,180/- ක් වැය කළේය.

වසර පුරා මාසික සාමාන්‍ය පුස්තකාල පරිහරණය සාමාජිකයන් 181 ක් පමණ වූ අතර සාමාන්‍ය මාසික පොත් සංසරණය 117 ක් විය. එය 2015 වසර හා සන්සන්දනය කිරීමේදි සාමාජික පරිහරණයේ 49% ක්, පොත් සංසරණයේ 10% ක අඩුවීමක් 2016 වසරේ පෙන්නුම් කළේය. එම අඩුවීමට හේතු විය හැක්කේ වාර්ෂික පොත් සමීක්ෂණය හේතුවෙන් මාස 2 ක පමණ කාලයක් පුස්තකාලය වසා තැබීමට සිදු වීමයි.




## 10. මූල්‍ය ක්‍රියාකාරකම්




*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2016, මා.ස.අ.ආ.*

2016 වසරේ මුළු ආදායම රු. මිලියන 240 කි. මුළු ආදායමන් රු. මිලියන 34 ක් රජයේ ප්‍රදාන වන අතර ආයතනය විසින් උත්පාදනය කළ ආදායම රු. මිලියන 178 කි. රු. මිලියන 30 ක් වෙනත් මූලාශ්‍රවලින් ලැබී ඇත. 2016 වර්ෂයේ මුළු වියදම රු. මිලියන 174 ක් වේ.

ස්තම්භ ප්‍රස්තාරය මගින් 2012 - 2016 කාල පරිච්ඡේදයේ ආයතනයේ මූල්‍ය තත්ත්වය දැක්වේ. සමස්ත ආදායම සහ මුළු වියදම ක්‍රමක්‍රමයෙන් වැඩිවෙමින් වෙනස් වී ඇත.

2016 වසරේදි සමස්ථ ආදායම සහ මුළු වියදම සැලකිය යුතු පරතරයක් පෙන්නුම් කෙරේ. එය 2015 වසරේදි 19%ක් වන පරතරය 2016 දි 39% කි. ඒ අනුව 2015 වසර හා සැසඳීමේදි 20% කින් ලාභය වැඩිවීමක් පෙන්නුම් කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ අතිරික්තය වැඩි වී ඇත.

**මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශුද්ධ අතිරික්ත ව්‍යාප්තිය 2012 - 2016**




*මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2016, මා.ස.අ.ආ.*

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

### 2016 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | 2016 (රු.) |
|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් වූ මුදල් ප්‍රවාහය | 12,292,564 |
| **මෙහෙයුම් අතිරික්තය (හිඟය)** | |
| කෙටි කාලීන තැන්පතු මගින් ලද පොලී ආදායම | (18,306,798) |
| පෙර වර්ෂ ගැලපීම් | 1,055,466 |
| ක්ෂයවීම් | 6,752,731 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 2,148,343 |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (2,135,978) |
| **මෙහෙයුම් අතිරික්තය (හිඟය)** | **1,806,327** |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීම | |
| භාණ්ඩ (වැඩිවීම/ අඩුවීම) | (33,915) |
| තැන්පතු (වැඩිවීම/ අඩුවීම) | 173,915 |
| පෙරගෙවුම් (වැඩිවීම/ අඩුවීම) | 547,376 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම් (වැඩිවීම/ අඩුවීම) | 15,458,432 |
| උපචිත වියදම්- වැඩිවීම | 9,072,736 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ජනනය වූ මුදල්** | **27,024,871** |
| පාරිතෝෂික ගෙවීම් | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **27,024,871** |
| | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් ජනිත මුදල් ප්‍රවාහ** | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් | 10,000,000 |
| කාර්ය මන්ඩල ණය හා අත්තිකාරම් (වැඩිවීම/ අඩුවීම) | 49,000 |
| ගෙවිය යුතු ගිණුම් (වැඩිවීම/ අඩුවීම) | (5,466) |
| වියදම් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | |
| උත්පාදන අරමුදල් | |
| ජංගම නොවන වගකීම් වැඩිවීම | 7,688,301 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **17,731,835** |
| | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් | (10,429,142) |
| කෙටි කාලීන තැන්පතුවල වැඩිවීම | (40,000,000) |
| කෙටි කාලීන තැන්පතුවල පොළිය | 7,847,121 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(42,582,021)** |
| | |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | 2,174,685 |
| 2016.01.01 දිනට මුදල් ශේෂය | 72,204,336 |
| 2016.12.31 දිනට මුදල් ශේෂය | **74,379,021** |
| **සටහන 1** | |
| මහජන බැංකුව - ගිණුම් අංක **086-1-001-3-1189652** | 7,379,319 |
| මහජන බැංකුව - ගිණුම් අංක **086-1-001-4-1189680** | 2,154,902 |
| මහජන බැංකුව - ගිණුම් අංක **086-1-001-2-1191306** | 31,403,263 |
| මහජන බැංකුව - ගිණුම් අංක **086-1-002-3-1189680** | 12,449,421 |
| මහජන බැංකුව - ගිණුම් අංක **086-1-001-4-0010037** | 4,000,431 |
| මහජන බැංකුව - ගිණුම් අංක **086-1-0022-1189652** | 16,991,685 |
| **එකතුව** | **74,379,021** |

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම්/ ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ සංශෝධිත ප්‍රකාශය**

| විස්තරය | සමුච්චිත අරමුදල | සංචිත සහ සීමා කරන ලද අරමුදල | වියදම් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | ත්‍යාග සහ පරිත්‍යාග | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2014.12.31 දිනට ශේෂය | 61,782,398.08 | 59,498,516 | 51,372,649 | 24,152,861.00 | 6,742 | 196,813,166.08 |
| පෙර වර්ෂයට අදාළ ගැලපීම් | 1,055,466.00 | | | | | 1,055,466.00 |
| 2015.12.31 දිනට ප්‍රතිශෝධිත ශේෂය | 62,837,864.08 | 59,498,516 | 51,372,649 | 24,152,861.00 | 6,742 | 197,868,632.08 |
| | | | | | | - |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් | | | | 10,000,000.00 | | 10,000,000.00 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන ගෙවීම් | | | 10,429,142 | (10,429,142.00) | | - |
| කෙටි කාලීන පාඨමාලාවලින් ප්‍රාග්ධන වියදම් පියවීම සඳහා දායකත්වය | | | | | | - |
| මා.ස.අ. ආයතන සංවර්ධන අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් පියවීම සඳහා දායකත්වය | (49,283,860.00) | 49,283,860 | (237,243) | | | (237,242.79) |
| මෝටර් රථ ප්‍රත්‍යාගණනය | | 1,655,060 | | | | 1,655,060.47 |
| මෝටර් රථ සඳහා ප්‍රතිපාදන | | | | | | - |
| විශේෂිත අභ්‍යන්තර අරමුදල්වල වැඩිවීම (වෙනත්) | | | | | | - |
| ක්‍රමක්ෂය | | | (2,135,978) | | | (2,135,978.00) |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ හිඟය | 61,576,423.89 | 4,980,597 | | | | 66,557,020.69 |
| | | | | | | |
| **2016.12.31 දිනට ශේෂය** | **75,130,427.97** | **115,418,033** | **59,428,570** | **23,723,719.00** | **6,742** | **273,707,492.45** |

## මානව සම්පත් අභිවර්ධන ආයතනය
### කොළඹ විශ්වවිද්‍යාලය
### 2016 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | 2016 (රු) | 2016 (රු) | 2015 (රු) | 2015 (රු) |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් සහ මුදල් සමතුලනයන් | 74,379,021 | | 72,204,336 | |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු ගිණුම් | 8,632,046 | | 24,090,478 | |
| කලින් කරන ලද ගෙවීම් | 65,858 | | 613,234 | |
| භාණ්ඩ/ තොග | 1,167,444 | | 1,133,529 | |
| | | 84,244,369 | | 98,041,577 |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| සේවක ණය සහ අත්තිකාරම් | 3,621,340 | | 3,670,340 | |
| කෙටි කාලීන තැන්පතු | 264,277,023 | | 217,018,297 | |
| දේපළ පිරියත සහ උපකරණ | 52,995,480 | | 44,284,221 | |
| | | 320,893,843 | | 264,972,858 |
| **මුළු වත්කම්** | | 405,138,212 | | 363,014,435 |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| උපචිත ගෙවීම් | 14,818,592 | | 5,745,856 | |
| ඉතුරුම් | 1,872,690 | | 1,698,775 | |
| | | 16,691,282 | | 7,444,631 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| ගෙවිය යුතු වියදම් | 1,399,677 | | 1,405,143 | |
| ඉදිරියට ලද ආදායම | 101,774,529 | | 147,935,205 | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම | 11,565,233 | | 9,416,890 | |
| | | 114,739,439 | | 158,757,238 |
| **මුළු වගකීම්** | | 131,430,721 | | 166,201,869 |
| | | | | |
| **මුළු ශුද්ධ වත්කම්** | | 273,707,491 | | 196,812,566 |
| **ශුද්ධ වත්කම් / සම වත්කම්** | | | | |
| වියදම් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | 59,428,570 | | 51,372,647 | |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | 23,723,718 | | 24,152,861 | |
| පරිත්‍යාග | 6,742 | | 6,742 | |
| | | 83,159,030 | | 75,532,250 |
| **සංචිත/ සමුච්චිත අරමුදල්** | | | | |
| පොදු සංචිත ගිණුම | 62,837,864 | | 49,176,205 | |
| ආදායම් සහ වියදම් ගිණුම | 12,292,564 | 75,130,428 | 12,605,594 | |
| ප්‍රත්‍යාගණන සංචිත | 4,655,060 | | 3,000,000 | |
| | | 79,785,488 | | 64,781,799 |
| **විශේෂිත අරමුදල්** | | 162,944,518 | | |
| මා.ස.අ.ආ සංවර්ධන අරමුදල | | 110,762,973 | 56,489,517 | |
| | | | - | |
| භාරකාර අරමුදල | | | 9,000 | |
| | | | | 56,498,517 |
| **මුළු ශුද්ධ වත්කම්/ හිමිකම** | | **273,707,491** | | **196,812,566** |





| | |
|---|---|
| **ජේ.එස්.වී.එන්.ටී. සොයිසා**<br>**ජ්‍යේ.ස. මූල්‍යාධිකාරී මා.ස.අ.ආ.** | **මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි**<br>**අධ්‍යක්ෂ/ මා.ස.අ.ආ.** |

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය**

**2016 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂයට මූල්‍ය කාර්ය සාධනය සඳහා වූ ප්‍රකාශය**

| විස්තරය | 2016 | 2015 |
|---|---|---|
| | | |
| **මෙහෙයුම් ආදායම** | | |
| රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන | 34,037,000 | 31,200,000 |
| ක්‍රමක්ෂය රජයේ ප්‍රතිපාදන ක්ෂය වීම | 2,135,978 | 3,963,826 |
| ආදායම - වෙනත් ආදායම | 27,364,860 | 21,126,390 |
| ආදායම -ව්‍යාප්ති වැඩසටහන් | 178,468,798 | 181,440,095 |
| | | |
| **සමස්ත මෙහෙයුම් ආදායම** | 242,006,636 | 237,730,311 |
| | | |
| **මෙහෙයුම් වියදම්** | | |
| කාර්යමණ්ඩල වැටුප් හා වේතන | 36,445,406 | 32,725,204 |
| ගමනාගමන වියදම් | 35,776 | 225,167 |
| සැපයුම් | 1,743,098 | 2,119,349 |
| නඩත්තු කාර්යයන් | 2,342,638 | 1,238,292 |
| ගිවිසුම්ගත සේවා | 4,158,355 | 3,150,265 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 3,942,350 | 3,428,474 |
| ක්ෂය වීම් | 6,752,731 | 11,954,752 |
| ව්‍යාප්ති වැඩසටහන් පිළිබඳ වියදම් | 125,009,858 | 158,447,477 |
| ලියා හැරීම් | | 3,975 |
| **මුළු මෙහෙයුම් වියදම්** | 180,430,212 | 213,292,955 |
| | | |
| **කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය)** | **61,576,424** | **24,437,356** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/බී/අයිඑච්ආර්ඒ/6/16    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2017 නොවැම්බර් 14 දින

අධ්‍යක්ෂ

මානව සම්පත් අභිවර්ධන ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතනය නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ කෙටිකාලීන පාඨමාලා සඳහා පවත්වාගෙන යන බැංකු ගිණුමෙහි වූ දීර්ඝ කාලීනව හඳුනා නොගත් රු.3,996,475 ක තැන්පතු, ආදායම් ප්‍රභවය හඳුනාගැනීමකින් තොරව උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් හා ගෙවිය යුතු දෑ යන වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.52,995,480 ක් වූ ස්ථාවර වත්කම්වල වටිනාකම තහවුරු කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකුට ලබාදී තිබුණු රු.191,100 ක් හා නිලධාරියෙකුට ලබාදී තිබුණු රු.84,944 ක ණය ශේෂ පිළිවෙලින් වසර 13 ක් හා වසර 06 ක් ගතවී තිබුණද අයකර ගැනීමට කටයුතුකර තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති , රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය<br>(i) I පරිච්ඡේදයේ 2.2 වගන්තිය | අතිකාල සේවයේ යෙදීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ආයතන සංග්‍රහයේ දක්වා ඇති පරිදි ගෙවීම් කිරීම වෙනුවට ස්ථාවර දීමනාවක් ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 325,283 ක් වැඩිපුර ගෙවා ඇති බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. |
| (ii) XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියළුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකුගේ පැමිණීම සනාථ කරගැනීමෙන් තොරව රු.14,519,885 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඇ) 2015 ජුනි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාළ කාර්යය නිමකළ විගසම අත්තිකාරම් පියවිය යුතු වුවත් අවස්ථා 05 කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.44,925 ක අත්තිකාරම් පියවීම සඳහා දින 60 සිට දින 110 ක් දක්වා කාලයක් ගතවී තිබූ අතර අවස්ථා 08 කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.115,381 ක් වූ අත්තිකාරම් 2017 ජනවාරි 24 දින වනවිටත් පියවා නොතිබුණි. |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

| | | |
|---|---|---|
| (ඇ) | 2004 ජුලි 29 දිනැති අංක පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යාපාර සතු මුදල් ආයෝජනය සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත් 2015 වර්ෂයේ රු.මිලියන 89.5 ක් හා 2016 වර්ෂයේ රු.මිලියන 40 ක් වටිනා ආයෝජන සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. |
| (ඉ) | 1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විභාගය පැවැත්වූ දින සිට මාස 03 ක කාලයක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් ඊට පටහැනිව ආයතනය විසින් 2015 හා 2016 වර්ෂ තුළදී පවත්වන ලද විභාග 05 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 05 ත් මාස 07 ත් අතර කාලයක් ගත කර තිබුණි. 2016 ජුනි මාසයේදී පවත්වා තිබූ විභාගයක ප්‍රතිඵල විගණිත දිනය වූ 2017 ජුනි 30 දක්වාම නිකුත් කර නොතිබුණි. |

## මූල්‍ය සමාලෝචනය

1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.61,576,424 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.24,437,356 ක් වූයේ ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.37,139,068 කින් වර්ධනය වී තිබුණි. විස්තාරිත පාඨමාලා සඳහා වන වියදම් රු. 33,437,619 කින් අඩුවීම සහ වෙනත් ආදායම් 2,112,639 කින් වැඩිවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2012 වර්ෂයේ රු.19,061,471 ක් වූ ආයතනයේ අතිරික්තය 2014 වර්ෂය අවසානයට රු.11,340,232 ක් දක්වා අඩුවී තිබුණද ඉන්පසු වර්ෂවලදී ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.576,424 ක්වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිතෝෂික ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.49,124,600 ක් වූ දායකත්වය 2014 වර්ෂය අවසානයට රු.47,458,572 ක් දක්වා අඩුවී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට රු.104,774,561 ක් දක්වා වර්ධනය වී තිබුණි.

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

ඉහළ ගුණත්වයෙන් යුතු අධ්‍යයන පාඨමාලා ප්‍රදානය තුළින් විශිෂ්ඨත්වයට පත්වීම, අධ්‍යයන පාඨමාලා කළමනාකරණය කිරීම තුළින් විශිෂ්ඨත්වයට පත්වීම, ආයතනය තුළ පර්යේෂණ සහ සංවර්ධන වටපිටාවක් නිර්මාණය කිරීම, ජාතික සංවර්ධනයට දායකවීම සඳහා පෞද්ගලික අංශය හා උපාය මාර්ගික සම්බන්ධතා ගොඩනගා ගැනීම, විශිෂ්ඨ ඵලදායි පරිපාලන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් විශිෂ්ඨත්වයට පත්වීම, විශ්වවිද්‍යාලය තුළ හරිත පරිසරයක් ගොඩනැගීම තුළින් විශිෂ්ඨත්වයට පත්වීම සහ සිත්ගන්නා සුළු ඉගැන්වීම, අධ්‍යයන හා පරිපාලන වටපිටාව තුළින් විශිෂ්ඨත්වයට පත්වීම යන කරුණු ආයතනයේ අරමුණු වුවද, එම අරමුණු ඉටුකරගැනීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව තිබූ ක්‍රියාකාරකම් 16 ක් අතුරින් ක්‍රියාකාරකම් 02 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ බව නිරීක්ෂණය විය.

ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් අපේක්ෂිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් පරිදි ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ අවසානයට කාර්යසාධන වාර්තාව ඉදිරිපත්කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් 2014 වර්ෂයේදී මාධ්‍ය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර තිබුණද මෙම පාඨමාලා පැවැත්වීම සඳහා ආයතනයේ විශේෂඥ දැනුමක් ඇති ආචාර්යවරුන් නොසිටී බැවින් 2014 වර්ෂයෙන් පසු පාඨමාලාව සඳහා සිසුන් බඳවාගෙන නොතිබුණි.

(ආ) 2014 ජුනි මස 01 දින කොළඹ විශ්වවිද්‍යාලයේ නව කලාගාරයේ පැවති ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය සඳහා භාවිතා කරන ලද ආයතනයට අයත් රු.69,900 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් අස්ථානගත වී තිබූ අතර ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා ආයතනයට සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන කටයුතු සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල පිහිටි පර්චස් 27.86 ක් වූ ඉඩම කොළඹ විශ්වවිද්‍යාලය සතු වන අතර එම ඉඩමෙහි අයිතිය පවරා ගෙන වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

2016 මාර්තු මාසයේදී රු. 10,000,000 ක් සියයට 4.5 ක පොලී අනුපාතයක් මත සත්දින තැන්පතුවක ආයෝජනය කර තිබුණද එය 2017 ජූනි දක්වාම එලෙසම පවත්වාගෙන ගොස් තිබුණි. මෙම මුදල වසරක කාලයක් සඳහා එදිනට පැවති සියයට 8.25 ක වාර්ෂික පොලී අනුපාතය යටතේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළේ නම් ආයතනයට රු.825,000 ක පොලී ආදායමක් උපයාගැනීමට හැකිව තිබූ අතර කෙටිකාලීනව ආයෝජනයේ යෙදවීම හේතුවෙන් ආයතනයට රු. 375,000 ක පමණ පොලී ආදායමක් අහිමි වී තිබුණි.

## 4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී මාධ්‍ය විද්‍යාගාරයක් (Media Lab) ආරම්භ කර තිබූ අතර ඒ සඳහා 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාව තුළ රු.10,425,293 ක් වටිනා උපකරණ සහ සමාලෝචිත වර්ෂයේදී රු.14,378 ක් වටිනා ලියන මේසයක් විද්‍යාගාරය සඳහා මිලදී ගෙන තිබුණි. එහෙත් මෙම විද්‍යාගාරය 2011 වර්ෂයේ සිටම භාවිතයට ගෙන නොතිබූ අතර එම වත්කම් මිලදීගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි. විද්‍යාගාරය නිසි ලෙස පවත්වාගෙන යාමට හෝ එය ප්‍රයෝජනයට ගත හැකි පාඨමාලාවක් ලෙස පවත්වාගෙන යැමට හැකි කුසලතාවයන්ගෙන් යුතු ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට ආයතනයට අවකාශයක් නොමැති බව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් 2017 ඔක්තෝම්බර් 04 දින දන්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති මුදල් හා කෙටිකාලීන ආයෝජන ශේෂයන්හි එකතුව රු.338,656,044 ක් වූ අතර එම ශේෂය තුළ වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු.23,723,718 ක් ඇතුළත්ව පැවතුණි. ඒ අනුව එම අරමුදල් එලදායී ලෙස ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් යොදවා ගැනීමකින් තොරව අඛණ්ඩව රඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

4.5 හඳුනාගත් පාඩු

---

සේවකයකු සඳහා අනුමත අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් අධිභාර ලෙස රු. 31,850 ක් ගෙවා තිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සංඛ්‍යාව 97 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 67 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 38 ක් විය. ආයතනයේ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත කථිකාචාර්ය තනතුරු 09 න් තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩල තනතුරුවලට අදාළ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමකින් තොරව 2016 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත වැඩසටහන් සහකාරවරුන් 19 දෙනෙක්ද කාර්යාල සහායක සහ සෞඛ්‍ය සේවා කම්කරු ලෙස සේවකයින් 21 දෙනෙකුද බඳවාගෙන තිබුණි.

5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

---

5.1 සංයුක්ත සැලැස්ම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකරගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර එය කාලනුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය. එහෙත් මෙම ආයතනයේ සංයුක්ත සැලැස්ම 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පිළියෙල කර තිබුණ ද එය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

---

2016 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් නොවූ අයිතමයන් 12 ක් රු.2,015,899 ක් වැයකර මිලදීගෙන තිබූ අතර ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී ආයතනයේ අවශ්‍යතාවයන් පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබීම. |
| (ආ) ආයෝජන කළමනාකරණය | ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීම සහ අවශ්‍යතාවය සලකා බලා ආයෝජන සිදු නොකිරීම. |
| (ඇ) ආදායම් කළමනාකරණය | පාඨමාලා ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| (ඈ) ගිණුම්කරණය | (i) කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය සහ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම.<br>(ii) පාඨමාලා ආදායම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත නොකිරීම. |
| (ඉ) සේවක ණය පාලනය | සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |

එච්.එම්. ගාමිණි විජේසිංහ
විගණකාධිපති

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 2<br>2.1 | **මූල්‍ය ප්‍රකාශන**<br>**තත්ත්වාගණනය කළ මතය** | මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. | එකඟ වේ. | |
| 2.2<br><br>2.2.1 | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**<br><br>**ගිණුම්කරණ අඩුපාඩු** | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | (අ) | ආයතනයේ කෙටිකාලීන පාඨමාලා සඳහා පවත්වාගෙන යන බැංකු ගිණුමෙහි වූ දීර්ඝ කාලීනව හඳුනානොගත් රු. 3,996,475 ක තැන්පතු, ආදායම් ප්‍රභවය හඳුනාගැනීමකින් තොරව උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ආදායම් ප්‍රභවයන් හඳුනාගැනීමට කටයුතු කර ඇති අතර ඉදිරි වර්ෂයන්හි මෙහි ආදායම් ප්‍රභවයන් හඳුනාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කර ඇත. | ආදායම් ප්‍රභවයන් හඳුනාගැනීම සිදුකර ඇති අතර එය 2017 වසරේ ගිණුම්වල නිවැරදි කර ඇත. |
| | (ආ) | කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් හා ගෙවිය යුතු දැ යන වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි නිවැරදිව කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදි. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 2.2.2 | **විගණනය සඳහා සාක්ෂි නොවීම** | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 52,995,480 ක් වූ ස්ථාවර වත්කම්වල වටිනාකම තහවුරු කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම සඳහා ආයතනය මගින් මෘදුකාංගයක් පිළියෙල කර ඇති අතර ඉදිරි වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනය ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර 2017 ගිණුම්වලදී ගැළපීම් කර ඇත. |
| 2.3 | **ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්** | ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකුට ලබාදී තිබුණු රු. 191,100 ක් හා නිලධාරියෙකුට ලබාදී තිබුණු රු. 84,944 ක ණය ශේෂ පිළිවෙලින් වසර 13 ක් හා වසර 06 ක් ගත වී තිබුණද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ කථිකාචාර්යවරයා රු. 191,100 ක ණය (ආපදා) ශේෂයක් පවතින අවස්ථාවක වැඩ තහනමකට ලක් වූ අතර මේ වන විට සේවයේ පිහිටුවා ඇත. ඉදිරි වර්ෂය අවසන් වන විට මෙම ණය මුදල අයකර ගැනීමට කටයුතු කරනු ඇත.<br><br>මෙම නිලධාරියා රු. 84,944 ක ණය (ආපදා) ශේෂයක් පවතින අවස්ථාවක සේවයෙන් විශ්‍රාම ලබා වෙනත් ආයතනයක (විදුලිබල මණ්ඩලය) සේවය සඳහා ගොස් ඇත. ඔහුගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල නිදහස් කරන අවස්ථාවේදී ණය ශේෂය වන රු. 84,944 සහ ඊට පොළී වශයෙන් රු. 70,861 ක මුදලක් අය කර ගෙන ඇත. අදාළ ලේඛන අමුණා ඇත. | අදාළ අයකරගැනීම් 2018 වර්ෂයේදී අය කර ගෙන ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| 2.4 | **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.** | | පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| | **නීති රීති රෙගුලාසිවලට යොමුව** | | | | |
| | (අ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | | | |
| | (i) | I පරිච්ඡේදයේ 2.2 වගන්තිය | අතිකාල සේවයේ යෙදීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ආයතන සංග්‍රහයේ දක්වා ඇති පරිදි ගෙවීම් කිරීම වෙනුවට ස්ථාවර දීමනාවක් ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 325,283 ක් වැඩිපුර ගෙවා ඇති බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මෙම ගෙවීම් කරනු ලැබ ඇත්තේ ආයතනය විසින් මුදල් අයකර පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන්ගෙන් වන අතර, එම ගෙවීම් කරනු ලබන්නේද එහි උපයන මුදලින් පමණි.<br><br>ආයතනය සතුව දේශනශාලා නොමැති බැවින් වෙනත් පීඨවලින් දේශනශාලා ලබා ගත යුතුය. එම දේශනශාලාවල සේවයේ නියුක්තවන සේවකයන් ආයතනයේ පාලනයට යටත් නොවන අතර එබැවින් නිවාඩු දිනයන්වලදී අතිකාල මත සේවය කිරීමට යොමු කරවා ගත නොහැක. එබැවින් ස්ථාවර මුදලක් සියලුම සේවකයන්ට ගෙවීමට සිදුවී ඇත. | |
| | (ii) | xx පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ සියලුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 06 දෙනෙකුගේ පැමිණීම සනාථ කර ගැනීමකින් තොරව රු. 14,519,885 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | ආචාර්යවරුන්ගේ දේශන පැවැත්වීම, දේශන පැවැත්වීම් ලේඛනයක් මගින් සටහන් කිරීම සිදු කරනු ලබයි. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| | (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ආයතනය විසින් ප්‍රත්‍යාගණනය වසර ගණනකින් සිදුකර නොමැති නමුත් මේ වන විට ප්‍රත්‍යාගණනය සිදු කර ඇති අතර භාණ්ඩ සමීක්ෂණය සාර්ථක ලෙස අවසන් කර ඇත. | 2017 වසරේ භාණ්ඩ සමීක්ෂණය සිදු කොට ඇත. |
| | (ඇ) | 2015 ජුනි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාළ කාර්ය නිමකළ විගසම අත්තිකාරම් ලියවිය යුතුවුවත් අවස්ථා 05 කදී ලබා ගෙන තිබූ වටිනාකම රු. 44,925 ක අත්තිකාරම් පියවීම සඳහා දින 60 සිට දින 110 ක් දක්වා කාලයක් ගත වී තිබූ අතර අවස්ථා 08 කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු. 115,381 ක් වූ අත්තිකාරම් 2017 ජනවාරි 24 වනවිටත් පියවා නොතිබුණි. | ලබාගත් අත්තාකාරම්වල ඉතිරි මුදල් නිසි පරිදි ගෙවා ඇති නමුත් බිල්පත් නිසි වේලාවට නොලැබීම, බිල්පතෙහි පවතින යම් යම් අඩුපාඩු නැවත සකස් කිරීමට සිදුවීම වැනි කරුණු හේතුවෙන් ඉතා සුළු අත්තිකාරම් ප්‍රමාණයක් පියවීමට කල්ගත වී තිබේ. පසුගිය වසරවලට සාපේක්ෂව ඉතා හොඳ ප්‍රගතියක් අප ළඟා කොටගෙන ඇති අතර එය තවදුරටත් වර්ධනය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ද | |
| | (ඈ) | 2004 ජූලි 29 දිනැති අංක පීඩී/35 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යාපාර සතු මුදල් ආයෝජනය සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වුවත් 2015 වර්ෂයේ රු. මිලියන 89.5 ක් හා 2016 වර්ෂයේ රු. මිලියන 40 ක් වටිනා ආයෝජන සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරයට දන්වා යවා ඇත. | |
| | (ඉ) | 1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විභාගය පැවැත්වූ දින සිට මාස 03 ක කාලයක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් ඊට පටහැනිව ආයතනය විසින් 2015 හා 2016 වර්ෂ තුළදී පවත්වන ලද විභාග 05 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 05 ත් මාස 07 ත් අතර කාලයක් ගතකර තිබුණි. 2016 ජුනි මාසයේදී පවත්වා තිබූ විභාගයක ප්‍රතිඵල විගණිත දිනය වූ 2017 ජුනි 30 දක්වාම නිකුත් කර නොතිබුණි. | පාඨමාලාවන්වල ඉගැන්වීම් සිදු කරනු ලබන ආචාර්යවරුන් විශ්වවිද්‍යාලයේ වෙනත් පීඨවලට අනුයුක්තව සිටින ආචාර්යවරුන්වන අතර, ඔවුන්ගේ පීඨවල කටයුතු සඳහා ප්‍රමුඛතාව ලබාදීම හේතුවෙන් පාඨමාලා කිහිපයක පමණක් ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 5-7 කාලයක් ගත වී ඇත. මෙම තත්ත්වය වළක්වා ගැනීමේ අරමුණින් ආචාර්යවරුන් සංඛ්‍යාව වැඩි කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගතහැකි වනු ඇත. | සියලුම පුරප්පාඩු 2018 වර්ෂයේදි සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 3<br>3.1 | **මූල්‍ය සමාලෝචනය**<br>**මූල්‍ය ප්‍රතිඵල** | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය, රු. 61,576,424 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 24,437,356 ක් වූයේ ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 37,139,068 කින් වර්ධනය වී තිබුණි. විස්තාරිත පාඨමාලා සඳහා වන වියදම් රු. 33,437,619 කින් වැඩිවීම ඉහත වර්ධන කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.<br><br>2012 වර්ෂයේ රු. 19,061,471 ක් වූ ආයතනයේ අතිරික්තය 2014 වර්ෂය අවසානයට රු. 11,340,232 ක් දක්වා අඩුවී තිබුණද ඉන් පසු වර්ෂවලදී ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු. 576,424 ක් වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිතෝෂික ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු. 49,124,600 ක් වූ දායකත්වය 2014 වර්ෂය අවසානයට රු. 47,458,572 ක් දක්වා අඩුවී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට රු. 104,774,561 ක් දක්වා වර්ධනය වී තිබුණි. | එකඟ වේ. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 4 | **මෙහෙයුම් සමාලෝචනය** | | | |
| 4.1 | **කාර්යසාධනය** | ඉහළ ගුණාත්වයෙන් යුතු අධ්‍යයන පාඨමාලා ප්‍රදානය කිරීම තුළින් විශිෂ්ඨත්වයට පත්වීම, අධ්‍යයන පාඨමාලා කළමනාකරණය කිරීම තුළින් විශිෂ්ඨත්වයට පත්වීම, ආයතනය තුළ පර්යේෂණ සහ සංවර්ධන වටපිටාවක් නිර්මාණය කිරීම, ජාතික සංවර්ධනයට දායක වීම සඳහා පෞද්ගලික අංශය හා උපාය මාර්ගික සම්බන්ධතා ගොඩනඟා ගැනීම, විශිෂ්ඨ ඵලදායි පරිපාලන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් විශිෂ්ඨත්වයට පත්වීම, විශ්වවිද්‍යාලය තුළ හරිත පරිසරයක් ගොඩනැඟීම තුළින් විශිෂ්ඨත්වයට පත්වීම සහ සිත්ගන්නා සුළු ඉගැන්වීම්, අධ්‍යයන හා පරිපාලන වටපිටාව තුළින් විශිෂ්ඨත්වයට පත්වීම යන ආයතනයේ අරමුණු වුවද, එම අරමුණු ඉටු කරගැනීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව තිබූ ක්‍රියාකාරකම් 16 ක් අතුරින් ක්‍රියාකාරකම් 02 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ බව නිරීක්ෂණය විය.<br>ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අපේක්ෂිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් පරිදි ආයතනය විසින් සමාලෝචිත වර්ෂයට කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | මෙම අයිතම යටතේ සඳහන් කර ඇති ක්‍රියාකාරී සැලැස්මේ ඇතැයි සඳහන් කර ඇති අතර ක්‍රියාමාර්ගවලින් පහත දැක්වෙන ක්‍රියාකාරකම් 2016 ක්‍රියාකාරී සැලැස්මට අදාළ වන අතර අනෙකුත් ක්‍රියාමාර්ග 2017 සැලැස්මට අදාළ වේ.<br><br>I. ශිෂ්‍ය උපදේශන මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීම.<br>II. කථිකාචාර්යවරුන් ඇගයීම සඳහා සම්යුරු සමාලෝචන ක්‍රමවේදය පවත්වාගෙන යාම.<br>III. අධ්‍යයන ක්‍රමවේදය ඇගයීම සඳහා තත්ත්ව ආරක්ෂණ ඒකකය පිහිටුවීම (2017 වසරේ සිට).<br>IV. ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීම හා ශ්‍රම අධ්‍යාපනවේදි මෙන්ම අනෙකුත් අධ්‍යයන වැඩසටහන්හි උපයෝජනය (හඳුන්වාදීම)<br>V. මාර්ගගත අයදුම්පත් ක්‍රමවේදය<br><br>ඉහත අයිතම අතරින් 2 හා 4 2016 වසරේ ඇරඹූ අතර ඒවා වැඩි දියුණු කරමින් පවති. | 2017 වසරේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 4.2 | **කළමනාකරණ ක්‍රියාකාරකම්** | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | (අ) | ආයතනය විසින් 2014 වර්ෂයේදී මාධ්‍ය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර තිබුණද මෙම පාඨමාලා පැවැත්වීම සඳහා ආයතනයේ විශේෂඥ දැනුමක් ඇති ආචාර්යවරුන් නොසිටි බැවින් 2014 වර්ෂයෙන් පසු පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගෙන නොතිබුණි. | එකඟ වේ. | |
| | (ආ) | 2014 ජුනි මස 01 දින කොළඹ විශ්වවිද්‍යාලයේ නව කලාගාරයේ පැවති ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය සඳහා භාවිත කරන ලද ආයතනයට අයත් රු.69,900 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් අස්ථානගත වී තිබූ අතර ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා ආයතනයට සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පරිගණක අස්ථානගත වීම පිළිබඳව වාර්තා කිරීමට ඒක පුද්ගල කමිටුවක් 2015.11.27 දින පත් කරන ලද අතර එම වාර්තාව ආයතනය වෙත 2017.01.05 දින වන විටත් ලැබී නොතිබුණි. එබැවින් 2017.01.05 දින අදාළ වියදම අයකර ගැනීම ලිපියක් නිකුත් කළ අතර එම ලිපියට 2017.01.10 දී පිළිතුරු ලැබී ඇති අතර ඒ අනුව කටයුතු කරමින් පවතී. | කමිටුවේ වැඩ කටයුතු අවසන් කොට ඇත. |
| | (ඇ) | ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන කටයුතු සඳහා ඉදිකර තිබූ ගොඩනැඟිල්ල පිහිටි පර්චස් 27.86 ක් වූ ඉඩම කොළඹ විශ්වවිද්‍යාලය සතු වන අතර එම ඉඩමෙහි අයිතිය පවරා ගෙන වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම කොළඹ විශ්වවිද්‍යාලය සතු වන අතර ඒ පිළිබඳව ගිණුම් සටහනක් මගින් 2017 වර්ෂයේ සිට දැක්වීමට සටහන් කර ගන්නා ලදි. | |
| **4.3** | **මෙහෙයුම් ක්‍රියාකරකම්** | 2016 මාර්තු මාසයේදී රු.10,000,000 ක් සියයට 4.5 ක පොලී අනුපාතයක් මත සත්දින තැන්පතුවක ආයෝජනය කර තිබුණද එය 2017 ජුනි දක්වාම එලෙසම පවත්වාගෙන ගොස් තිබුණි. මෙම මුදල වසරක කාලයක් සඳහා එදිනට පැවති සියයට 8.5 ක වාර්ෂික පොලී අනුපාතය යටතේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළේ නම් ආයතනයට රු. 825,000 ක පොලී ආදායමක් උපයා ගැනීමට හැකිව තිබූ අතර කෙටිකාලීනව ආයෝජනයේ යෙදවීම හේතුවෙන් ආයතනයට රු. 375,000 ක පමණ පොලී ආදායමක් අහිමි වී තිබුණි. | මෙය ගොඩනැඟිලි ඉදිකිරීම් සඳහා අවශ්‍ය වනවිට නිදහස් කර ගැනීම සඳහා මෙලෙස මුදල් ප්‍රමාණයක් සත්දින තැන්පතුවල ආයෝජනය කර ඇත. | වර්තමානයේ ස්ථාවර තැන්පතුවල පමණක් මුදල් ආයෝජනය කර ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 4.4 | **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්** | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | (අ) | 2011 වර්ෂයේදී මාධ්‍ය විද්‍යාගාරයක් (Media Lab) ආරම්භ කර තිබූ අතර ඒ සඳහා 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාව තුළ රු. 10,425,293 ක් වටිනා උපකරණ සමාලෝචිත වර්ෂයේදී රු. 14,378 ක් වටිනා ලියන මේසයක් විද්‍යාගාරය සඳහා මිලදී ගෙන තිබුණි. එහෙත් මෙම විද්‍යාගාරය 2011 වර්ෂයේ සිටම භාවිතයට ගෙන නොතිබූ අතර එම වත්කම් මිලදීගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි. විද්‍යාගාරය නිසි ලෙස පවත්වාගෙන යාමට හෝ එය ප්‍රයෝජනයට ගත හැකි පාඨමාලාවක් ලෙස පවත්වාගෙන යෑමට කුසලතාවයන්ගෙන් යුතු ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට ආයතනයට අවකාශයක් නොමැති බව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් 2017 ඔක්තෝබර් 04 දින දන්වා තිබුණි. | මෙම මාධ්‍ය විද්‍යාගාරය නිසි ලෙස පවත්වාගෙන යාමට හෝ එය ප්‍රයෝජනයට ගත හැකි පාඨමාලාවක් ලෙස පවත්වාගෙන යාමට හැකි කුසලතාවයන්ගෙන් යුතු ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට ආයතනයට අවකාශයක් නොමැත. තවද ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ ආයතනය සතුව තිබෙන හෝ ආයතනයට ලබා ගැනීමට හැකිවන මානව සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පවත්වාගෙන යා හැකි පාඨමාලාවන් පමණක් පවත්වාගෙන යාමට තීරණය කර ඇත. ඒ අනුව එම විද්‍යාගාරය සතුව ඇති සම්පත් සුදුසු ලෙස ආයෝජනය කිරීමට හෝ එම සම්පත් ඵලදායි ලෙස භාවිත කළ හැකි වෙනත් අංශයකට පැවරීමට සාකච්ජා පැවැත්වෙමින් තිබේ. | ශාස්ත්‍රීය කමිටුමේටුවේ අනුමැතියට යටත්ව එම ඒකකයේ පැවති භාණ්ඩ කොළඹ විශ්වවිද්‍යාලයේ වෙනත් අංශයකට පවරනු ලැබීය. එම අංශය විසින් එම උපකරණ පරිහරණය කරනු ලබයි. |
| | (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති මුදල් හා කෙටිකාලීන ආයෝජන ශේෂයන්හි එකතුව රු.338,656,044 ක් වූ අතර එම ශේෂය තුළ වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු. 23,723,718 ක් ඇතුළත්ව පැවතුණි. ඒ අනුව එම අරමුදල් ඵලදායි ලෙස ආයතනයේ අරමුණු ඉටකර ගැනීම වෙනුවෙන් යොදවා ගැනීමකින් තොරව අඛණ්ඩව රඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය. | මෙය 2017 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම වැයකර ඇත. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 4.5 | **හඳුනාගත් පාඩු** | සේවකයකු සඳහා අනුමත අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් අධිභාර ලෙස රු. 31,850 ක් ගෙවා තිබුණි. | එකඟ වේ. | |
| 4.6 | **කාර්ය මණ්ඩල පරිපාලනය** | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | (අ) | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සංඛ්‍යාව 97 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 67 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 38 ක් විය. ආයතනයේ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත කථිකාචාර්ය තනතුරු 09 න් තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතුණි. | ආයතනයේ 2016 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය 59 කි. 2016 වසර අවසානයේදී කාර්ය මණ්ඩලය වූයේ 28 කි. කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම දැනටත් සිදුකරමින් පවතින අතර, 2017 වසර තුළදී පුස්තකාල සහකාර තනතුර සඳහා 02 ක්, වැඩ සහායක තනතුරු සඳහා 03 ක් හා කළමනාකරණ සහකාර තනතුර සඳහා 11 දෙනෙක්ද බඳවා ගැනීමට කටයුතු කර ඇත. තවත් කළමනාකරණ සහකාර තනතුරු 09 ක් සහ කාර්මික සහකාර තනතුරු 06 ක් සඳහා බඳවා ගැනීමට අවශ්‍ය ලැයිස්තු අදාළ අංශවලින් ඉල්ලා ඇත. 2016 සහ 2017 වර්ෂවලදී කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බඳවා ගත් අතර, 2018 වසරේදී තවත් කථිකාචාර්යවරු දෙදෙනෙක් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. සියලුම කථිකාචාර්යවරුන් එකවර බඳවා ගැනීම තුළින් ඇති විය හැකි දුෂ්කරතා (සියලු දෙනාම එකවර අධ්‍යයන නිවාඩු ලබා ගැනීම වැනි) මඟ හරවා ගැනීම සඳහා අදාළ තනතුරු පිරවීම සුදුසු කාල පරතරයක් ඇතිව කරනු ලැබේ. | කළමනාකරණ සහකාර තනතුර සඳහා පැවැත්වීමට නියමිතව තිබූ යෝග්‍යතා පරීක්ෂණය සහ කාර්මික සහකාර තනතුර සඳහා පැවැත්වීමට නියමිත ව තිබූ තෝරාගැනීමේ පරීක්ෂණ 2016.06.01 දාතමින් යුතු උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් එවනු ලැබූ දැනුම්දීමට අනුව අවලංගු කිරීමට කටයුතු කරන ලදී.<br><br>පොත් තැබීමේ නිලධාරි සහ රියදුරු තනතුරු දෙකෙහි පැවති පුරප්පාඩු සම්පූර්ණ කරන ලදී. |
| | (ආ) | අනුමත කාර්ය මණ්ඩල තනතුරුවලට අදාළ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමකින් තොරව 2016 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත වැඩසටහන් සහකාරවරුන් 19 දෙනෙක්ද කාර්යාල සහායක සහ සෞඛ්‍ය සේවා කම්කරු ලෙස සේවකයින් 21 දෙනෙක්ද බඳවාගෙන තිබේ. | ආයතනයේ අවශ්‍යතාවය මත කොන්ත්‍රාත් පදනම යටතේ සහකාර තනතුරු 25 සහ වෙනත් විවිධ කොන්ත්‍රාත් පදනම මත තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට 2016 වසරේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ආයතනය විසින් ඉල්ලීමක් කරන ලද අතර 2017 වර්ෂයේදී දී එයට අනුමැතිය ලබා දී ඇත. | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන්නේ අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා බඳවා ගැනමේ ක්‍රමවේදයට අනුකූලවය. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 5. | **ගිණුම් කටයුතු සහ යහපාලනය** | | | |
| 5.1 | **සංයුක්ත සැලැස්ම** | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටු කරගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර එය කාලානුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය. එහෙත් මෙම ආයතනයේ සංයුක්ත සැලැස්ම 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පිළියෙල කර තිබුණද එය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම 2016 වසර සඳහා යාවත්කාලීන කර තිබූ අතර, ඒ සඳහා ශාස්ත්‍රීය සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2018 - 2022 සංයුක්ත සැලැස්ම සකස් කොට ඇත. |
| 5.2 | **ප්‍රසම්පාදන සැලැස්ම** | 2016 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් නොවූ අයිතමයන් 12 ක් රු. 2,015,899 ක් වැයකර මිලදීගෙන තිබූ අතර ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී ආයතනයේ අවශ්‍යතාවයන් පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | 2016 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි සිදු වූ ප්‍රමාද දෝෂයන් 2017 වර්ෂයේ සිදු නොවීමට දැඩි අවධානයක් යොමු කිරීමට අදාළ අංශවලට උපදෙස් දී ඇති බව සටහන් කරමි. | |
| 6. | **පද්ධති හා පාලනයන්** | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුයි. | | |
| | **පද්ධති පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** | | |
| | (අ) ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබීම. | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කරමින් පවතින අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සාර්ථක ලෙස අවසන් කෙරෙමින් පවතී. | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කොට ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|---|
| | **(ආ)** | **ආයෝජන කළමනාකරණය** | ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සහ අවශ්‍යතාවය සලකා බලා ආයෝජන සිදු නොකිරීම. | | අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරයට දන්වා යවා ඇත. | |
| | **(ඇ)** | **ආදායම් කළමනාකරණය** | පාඨමාලා ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. | | සෘජු බැංකු තැන්පත් හඳුනා ගැනීමට බැංකුව සමඟ සාකච්ඡා කර වැඩ පිළිවෙලක් සකසමින් පවතින අතර නව පරිගණක මෘදුකාංගයක් යොදාගැනීමට නව වැඩපිළිවෙලක් ගොඩනැගෙමින් පවතී. | අදාළ මෘදුකාංගය මිලදී ගෙන ඇති අතර එම මෘදුකාංගය යොදා ගෙන වැඩකටයුතු කිරීමට අදාළ බැංකුව සමග 2018 ජුනි මාසයේදී ගිවිසුමකට එළඹීමට නියමිතය. |
| | **(ඇ)** | **ගිණුම්කරණය** | (i) | කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය සහ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. | අනුමත කාර්ය මණ්ඩල පිරවීමට කටයුතු කර ඇත. | |
| | | | (ii) | පාඨමාලා ආදායම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත නොකිරීම. | | |
| | **(ඉ)** | **සේවක ණය පාලනය** | සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. | | අය නොකල ණය මුදල් 2017 වසර අවසන් වන විට අය කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | 2018 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම අය කර ගෙන ඇත. |